# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 සැප්තැම්බර් මස 07 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 සැප්තැම්බර් මස 12 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 60.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 45.00 යි.**

## 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත

[සහතිකය සටහන් කළේ 2014 සැප්තැම්බර් මස 07 වන දින]

එල්.ඩී.—ඕ. 31/2011.

**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා ද; ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය සඳහා මං සලසන පාඨමාලා සඳහා පහසුකම් සැළසීමේ දී අවශ්‍ය නෛතික යටිතල පහසුකම් සැලැසීම පිණිස ද; 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත ඉවත් කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකාවේ ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍යතාවයක් ඇති හෙයින් ද:

තව ද, ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ නිපුනතා වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමට අවශ්‍ය වී ඇති හෙයින් ද:

ඉහත කී ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා හදාරණ තැනැත්තන් විසින් ලබා ගන්නා උසස් අධ්‍යාපන සුදුසුකම් ශ්‍රී ලංකාව ඇතුළත සහ ඉන් පිටත පිළිගන්නා බවට සහතික වීම සඳහා අවශ්‍ය වී ඇති හෙයින් ද:

මෙම ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් විසින් අත්කර ගන්නා දැනුම රටේ සංවර්ධනය උදෙසා ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉහත කී ක්ෂේත්‍ර පිළිබඳ දැනුමක් ලබා දීම සඳහා විශ්වවිද්‍යාලයක් පිහිටුවීම ජාතික වැදගත්කමක් ඇති කාරණයක් වී හෙයින් ද.

එසේ හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතේ මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

2—PL 008388—2,200 (2014/08)

## I වන කොටස
## ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීම

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීම.

**2.** (1) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද, (මේ පනතේ මෙහි මින්මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය නම් වූ විශ්වවිද්‍යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) විශ්වවිද්‍යාලය අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, (1) වන උපවගන්තිය මගින් ඊට වෙන්කර දී ඇති නාමයෙන් එය විසින් සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

විශ්වවිද්‍යාලයේ මුද්‍රාව.

**3.** (1) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාගේ භාරකාරත්වය යටතේ තිබිය යුතු, පොදු මුද්‍රාවක් තබා ගැනීමට සහ භාවිත කිරීමට විශ්වවිද්‍යාලයට සම්පූර්ණ බලය සහ අධිකාරිය ඇති අතර, එම මුද්‍රාව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) ලේඛකාධිකාරීවරයා විසින් හෝ තත්කාර්ය සඳහා උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් එම ලේඛනයේ හෝ සාධන පත්‍රයේ සිය අත්සන තැබිය යුතු, වෙනත් යම් නිලධරයකු ඉදිරිපිට දි හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මුද්‍රාව නොතැබිය යුතු ය.

## II වන කොටස
## විශ්වවිද්‍යාලයේ අරමුණු සහ බලතල

විශ්වවිද්‍යාලයේ අරමුණු.

**4.** විශ්වවිද්‍යාලයේ අරමුණු වනුයේ—

(අ) ධීවර, සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම;

(ඇ) ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම;

(ඈ) ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම;

(ඉ) විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම;

(ඊ) ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැළැස්වීම; සහ

(උ) ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීනත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

විශ්වවිද්‍යාලයේ බලතල.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:—

(අ) නිශ්චල සහ චංචල දේපල යන දෙවර්ගයම මිල දී ගැනීම මගින් හෝ අන්‍යාකාරයකට අත්කර ගැනීම සහ එසේ මිල දී ගැනීම මගින් හෝ අන්‍යාකාරයකට විශ්වවිද්‍යාලය වෙත පැවරෙන එවැනි දේපල ලබා ගැනීම, භාර ගැනීම සහ දරා සිටීම:

එසේ වුව ද, විශ්වවිද්‍යාලයේ යම් නිශ්චල දේපලක් නිපුණතා සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව බැහැර කරනු නොලැබිය යුතු ය;

(ආ) මේ පනත මගින් විශ්වවිද්‍යාලය වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම;

(ඇ) විවිධ වර්ගයේ අපේක්ෂකයන් සඳහා වන ඇතුළත් කර ගැනීමේ උපමාන සහ 23 වන වගන්තිය යටතේ ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීමේ සභාව විසින් නිර්දේශ කරනු ලබන යෝග්‍යතා පරීක්ෂණයක් ද මත ශිෂ්‍යයන් ඇතුළත් කරගැනීම සහ විශ්වවිද්‍යාලයේ අරමුණුවලට අනුකූලව සකස්කර ඇති අධ්‍යයන පාඨමාලා සඳහා උපදෙස් ලබා දීම;

(ඈ) විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ කාර්යය සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති හෝ පිහිටුවා ඇති බවට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක සහ යම් උසස් අධ්‍යාපන ආයතනයක, කාර්මික සහ වෘත්තීයමය හෝ යම් වෘත්තීය ආයතනයක විභාග සහ අධ්‍යයන වැඩසටහන් කරන ලද කාලසීමාවන් පිළිගැනීම;

(ඉ) ධීවර හා සාගර විද්‍යාව සහ සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවලට අදාළ අධ්‍යයන වැඩසටහන් සහ පුහුණු වැඩ සටහන් පැවැත්වීම;

(ඊ) (ඉ) ඡේදය නිශ්චිතව දක්වා ඇති වැඩසටහන් පිළිබඳ විභාග පැවැත්වීම සහ එම ශිෂ්‍යන්ගේ කාර්ය සාධනය ඇගයීම;

(උ) තත්කාර්ය සඳහා පනවා ඇති යම් ප්‍රඥප්තියකට අනුකූලව උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සහ ලබා දීම;

(ඌ) අදාළ ක්ෂේත්‍රවල වෘත්තීය පුහුණුව සඳහා ජාතික ධීවර හා සමුද්‍රීය පුහුණු ආයතනය ඇතුළුව ආයතන පිහිටුවීම;

(එ) පළාත් සහ ප්‍රාදේශීය පදනමක් මත සාගර විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථාන සහ මණ්ඩප පිහිටුවීම;

(ඒ) විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සඳහා ගාස්තු හෝ වෙනත් අයකිරීම් අයකර ගැනීම;

(ඔ) අවස්ථාවෝචිත පරිදි, මහජනතාවට හෝ වෙනත් ආයතනයකට සපයනු ලබන ව්‍යාප්ත සේවා සඳහා ගාස්තු අය කිරීම සහ එසේ ලැබුණු ආදායම නියමාවලි මගින් නියම කරන ඇති ආකාරයට විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වියදම් කිරීම;

(ඕ) උපදේශක සහ වෙනත් ආදායම් උපදින කර්තව්‍ය භාරගැනීම සහ ඉන් ලැබෙන ආදායම විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් යෝජනාක්‍රමයක සංවර්ධනය සඳහා යෙදවීම;

(ක) විශ්වවිද්‍යාලයේ කර්තව්‍ය කරගෙන යාම සඳහා අවශ්‍ය වන විගණන සහ කළමනාකරණ කමිටුවක් ද, ඇතුළු යම් කමිටුවක් හෝ උපකමිටුවක් පිහිටුවීම;

(ග) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් උචිත යයි විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සළකනු ලබන ආකාරයකට ආයෝජනය කිරීම;

(ච) විශ්වවිද්‍යාලයේ අරමුණු හෝ පරමාර්ථවලට සමාන අරමුණු හෝ පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත වෙනත් ආයතන සමග ගුරුවරුන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රවේදීන් හුවමාරු කර ගැනීම මගින් එම ආයතන සමග සහයෝගයෙන් කටුයතු කිරීම;

(ජ) අනුබද්ධිත ආයතනවල සිටින තැනැත්තන් සඳහා විභාග පැවැත්වීම සඳහා කටයුතු සැළැස්වීම සහ විශ්වවිද්‍යාලයේ දී අධ්‍යයන උපදෙස් නොලැබෙන තැනැත්තන්ට

විශ්වවිද්‍යාලයෙන් උපාධි, ඩිප්ලෝමා සහ සහතික ලබාගැනීමට හැකිවන පරිදි කටයුතු සැලැස්වීම සහ එම විභාග සඳහා උපදෙස් පාඨමාලා තීරණය කිරීම;

(ට) විශ්වවිද්‍යාලය මගින් සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ට උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැළසීම;

(ඩ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයන්ට පර්යේෂණ කටයුතු සඳහා අවස්ථා ලබා දීම සහ එමගින් දැනුම වර්ධනය කර ගැනීමට සහ බෙදා හැරීමට කටයුතු සැළැස්වීම;

(ණ) තත්කාර්ය සඳහා සාදනු ලබන යම් ප්‍රඥප්තියකට අනුකූලව ශාස්ත්‍රීය සභාව සහ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තැනැත්තන් වෙත ගෞරව උපාධි හෝ වෙනත් විශිෂ්ටතා ප්‍රදානය කිරීම;

(ත) තත්කාර්ය සඳහා සාදනු ලබන යම් ප්‍රඥප්තියකට අනුකූලව අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග පිරිනැමීම;

(ද) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුර, මහාචාර්ය ධුර, සහාය මහාචාර්ය ධුර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුර, කථිකාචාර්ය ධුර, සහකාර කථිකාචාර්ය ධුර සහ වෙනත් අනධ්‍යයන තනතුරු හඳුන්වා දීම;

(න) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඉගැන්වීමේ කාර්ය සඳහා පුස්තකාල, විද්‍යාගාර සහ වෙනත් ගොඩනැගිලි පිහිටුවීම සහ ඒවා පවත්වාගෙන යෑම;

(ප) මේ පනත යටතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ සේවයෙන් නෙරපීමේ බලතල ක්‍රියාත්මක කිරීම;

(ඞ) විශ්වවිද්‍යාලයේ නිලධරයන් සහ සේවකයන්ගේ ප්‍රතිලාභය උදෙසා අර්ථ සාධක අරමුදල් යෝජනාක්‍රම හෝ විශ්‍රාම වැටුප් යෝජනාක්‍රම පිහිටුවීම සහ විධිමත් කිරීම සහ එවැනි යම් යෝජනාක්‍රමවලට දායක මුදල් ගෙවීම;

(ම) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති යම් බැංකුවක හෝ බැංකුවල බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම; සහ

(ය) මේ පනත යටතේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

(2) ඉහත දක්වා ඇති බලතල මේ පනත මගින් අන්‍යාකාරයකට ප්‍රකාශිතව ම විධිවිධාන සළස්වා ඇත්නම් මිස, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

## III වන කොටස
## අමාත්‍යවරයාගේ බලතල

**6.** (1) මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා වගකිව යුතු ය. අමාත්‍යවරයාගේ වගකීම් සහ බලතල.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සිය වගකීම ඉටු කිරීමේ දී, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විමසා, විශ්වවිද්‍යාලය නිසි පරිදි පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය විය හැකි යයි ඔහු විසින් සළකනු ලබන ලිඛිත විධාන ඔහු විසින්, කළින් කළ, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි එවැනි සියලු විධානවලට අනුකූලව ක්‍රියාකිරීම විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ කාර්ය වන්නේ ය.

(4) මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමට අදාළව සිය වගකීම් ඵලදායි ලෙස ඉටු කිරීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලයේ පරිපාලනයට අදාළ සියලු කටයුතු හෝ යම් කටයුත්තක් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් විමර්ශනය කර තමා වෙත වාර්තා කළ යුතු බවට අමාත්‍යවරයා විසින්, කළින් කළ නියම කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ කරගෙන යන ලද විමර්ශනයකට අනුකූලව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සපයන ලද වාර්තාවක් ලැබීමේ දී අමාත්‍යවරයා විසින් එම වාර්තාව සළකා බැලීමෙන් පසු (4) වන උපවගන්තිය යටතේ විමර්ශනයක් කරනු ලැබූ විශ්වවිද්‍යාලයේ පරිපාලනයට අදාළ ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් උචිත යයි සළකනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයට විධානය කළ යුතු ය.

පවතින තත්ත්වය ජාතික ආරක්ෂාව ආදියට අනතුරුදායක විය හැකි අවස්ථාවල දී.

7. විශ්වවිද්‍යාලය තුළ පවතින යම් තත්ත්වයක් ජාතික ආරක්ෂාවට අනතුරුදායක වීමේ නැඹුරුවක් හෝ ජාතික ප්‍රතිපත්තියට අහිතකර හෝ අගතිදායක බව නැතහොත් එම තත්ත්වය මගින් විශ්වවිද්‍යාලයේ නිසි ක්‍රියාකාරීත්වය බිඳ වැටීමේ නැඹුරුවක් ඇති බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, එම තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පියවර ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයට විධාන කරනු ලැබිය හැකි ය.

වැඩ වැරීම වැනි අවස්ථාවල දී අමාත්‍යවරයා විසින් ගත යුතු පියවර.

8. (1) යම් වැඩ වර්ජනයක්, වැඩ වැරීමක් හෝ එවැනි යම් අවස්ථා හේතුකොට ගෙන විශ්වවිද්‍යාලයේ වැඩ හෝ පරිපාලනය බරපතල ලෙස බිඳ වැටී ඇති බව සහ සාමාන්‍ය තත්ත්වය නැවතත් ඇති කිරීමට එහි අදාළ බලධාරීන් අපොහොසත් වී ඇති බව උපකුලපතිවරයා විමසා අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය තත්ත්වය නැවත ඇති කරවන බවට සහතික කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පියවර අමාත්‍යවරයා විසින් ගත යුතු ය. විශ්වවිද්‍යාලය සාමාන්‍ය තත්ත්වයට පත්කිරීමට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් උචිත යයි සළකනු ලබන ක්‍රියාමාර්ග ඔහු විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි ය:—

(අ) විශ්වවිද්‍යාලය වසා දැමීම;

(ආ) මේ පනත යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, අධිකාරියක් හෝ වෙනත් මඩුල්ලක්

වෙනුවට නිසි බලධරයකු වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් පත් කිරීම;

(ඇ) (අ) හෝ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් වූ හෝ ඊට අදාළ වූ වෙනත් යම් කාරණයක්;

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියමයක් එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් දිනයක සිට බලාත්මක විය යුතු අතර, එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමේ දින සිට එක් මාසයක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය. එම නියමය, එය කලින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබුවහොත් මිස, එම නියමයේ දින සිට මාස තුනකට නොවැඩි කාලයක් බලාත්මකව පැවතිය යුතු ය.

**9.** (1) එක් එක් මුදල් වර්ෂය අවසන් වීමට පසු මාස හයක කාලයක් ඉකුත්වීමට පෙර, අදාළ වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් වාර්තාවක් විශ්වවිද්‍යාලය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් එම වාර්තාවේ පිටපත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සැලැස්විය යුතු ය. විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවේ පිටපත් විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලැබිය හැකි ගාස්තුවක් ගෙවීමේ දී මහජනතාවට ලබා ගැනීමට හැකිවිය යුතු ය.

## IV වන කොටස
## විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා සහ නිලධරයන්

**10.** (1) ජනාධිපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා විය යුතු විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා පත්කරනු ලැබිය යුතු අතර, ඔහු එම පත්වීමේ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය. විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා සහ නිලධරයන්.

(2) කුලපතිවරයා පැමිණ සිටී නම්, ඔහු විශ්වවිද්‍යාලයේ සෑම උපාධි ප්‍රදානෝත්සවයක ම මුලසුන දැරිය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයන් පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) උපකුලපතිවරයා;

(ආ) නියෝජ්‍ය උපකුලපතිවරයා (සිටිනම්);

(ඇ) එක් එක් මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයා;

(ඈ) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා;

(ඉ) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා;

(ඊ) අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා;

(උ) අධ්‍යක්ෂ, මුදල්;

(ඌ) අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව; සහ

(එ) විශ්වවිද්‍යාලයේ නිලධරයකුගේ ධූරයක් වන බවට යම් ප්‍රඥප්තියක් මගින් ප්‍රකාශයට පත්කරන ලද ධූරයක් දරන යම් තැනැත්තෙක්.

උපකුලපතිවරයා.

11. (1) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තන් තුන්දෙනකුගෙන් සමන්විත වන මූල මණ්ඩලයක් අතුරින් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා නම් කරනු ලැබීමට නියමිත තුන් දෙනකුගෙන් සමන්විත මූල මණ්ඩලය, ඉංජිනේරු විද්‍යාව, ධීවර කර්මාන්තය, විද්‍යාව, තාක්ෂණවේදය, කළමනාකරණය හෝ වෙනත් යම් අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳ ශාස්ත්‍රීය සුදුසුකම්, දැනුම හා පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරින් තෝරාපත් කර ගත යුතු ය.

(3) උපකුලපතිවරයා අවුරුදු හතරක කාලයක් සඳහා ධූර දැරිය යුතු ය. එසේ වුව ද, යම් තැනැත්තකු අනුක්‍රමික ධූර කාල දෙකකට වැඩි ගණනක් සඳහා උපකුලපතිවරයකු ලෙස පත්කරනු නොලැබිය යුතු ය.

(4) උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු අතර, ඔහු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය සහ ශාස්ත්‍රීය සභාව යන දෙකෙහිම නිල බලයෙන් පත්වන සාමාජිකයකු සහ සභාපතිවරයා විය යුතු ය. උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ වෙනත් යම් බලමණ්ඩලයක නැතහොත් නියාමවලි මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මණ්ඩලයක රැස්වීමක් කැඳවීමට සහ ඊට සහභාගි වීමට සහ කථා පැවැත්වීමට හිමිකමක් ඇති නමුත් ඔහු එම බලමණ්ඩලයේ හෝ වෙනත් මණ්ඩලයක සාමාජිකයකු වන්නේ නම් මිස, ඒවායේ රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට හිමිකමක් නොතිබිය යුතු ය.

(5) විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා උපකුලපතිවරයා වෙත, කලින් කල, නීත්‍යානුකූලව නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව, උපකුලපතිවරයා විසින් මේ පනතේ විධිවිධාන සහ යම් උචිත සාධනපත්‍ර යථාපරිදි පිළිපදින බවට සහතිකවීම සහ තත්කාර්ය සඳහා අවශ්‍ය යයි සළකනු ලබන සියලු බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබීම උපකුලපතිවරයාගේ කාර්ය විය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත් ව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ සහ ශාස්ත්‍රීය සභාවේ තීරණ බලාත්මක කිරීම සහ එම තීරණ බලාත්මක කරනු ලබන බවට සහතිකවීම උපකුලපතිවරයාගේ කාර්ය වන්නේ ය.

(7) උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ගිණුම් නිලධරයා විය යුතු අතර විශ්වවිද්‍යාලයේ විනය පාලනය සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

(8) උපකුලපතිවරයා ඔහු විසින් කලින් ධුරය අත්හලහොත් හෝ මේ වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස ඔහුට වයස අවුරුදු හැටපහ එළඹීම හෝ ඔහුගේ ධුර කාලය ඉකුත්වීම යන දෙකෙන් කලින් එළඹෙන අවස්ථාව දක්වා ධුර දැරිය හැකි ය.

(9) ජනාධිපතිවරයා විසින් හේතු දක්වා උපකුලපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(10) නිවාඩු ලබා තිබීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා උපකුලපතිවරයාට සිය

ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක නියෝජ්‍ය උපකුලපතිවරයකු සිටින්නේ නම් ඔහු විසින් උපකුලපතිවරයා වෙනුවෙන් එම කාර්ය ඉටු කළ යුතු ය. නියෝජ්‍ය උපකුලපතිවරයකු නොමැති නම් අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ නිර්දේශය ඇතිව එම නොහැකියාව සිදු වීමේ දින සිට දින හතක් ඇතුළත එම ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා ඔහු විසින් සුදුසු යැයි සළකනු ලබන වැඩපිළිවෙලක් සකස් කළ යුතු ය. එම වැඩ පිළිවෙල සකස් කරනු ලබන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් උපකුලපති ධුරයේ එදිනෙදා කාර්ය ඉටුකළ යුතු ය.

(11) උපකුලපති ධුරයේ යම් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක ජනාධිපතිවරයා විසින් එම පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත ස්ථිර පත්වීමක් සිදුකරනු ලබන තෙක් එම ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි සළකනු ලබන වැඩපිළිවෙලක් සකස් කළ යුතු ය. එවැනි වැඩපිළිවෙලක් සකස් කරනු ලබන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් එම ධුරයේ එදිනෙදා කාර්ය ඉටු කළ යුතු ය.

විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිවරයා

**12.** නියමාවලියක් මගින් සංයුතිය නියම කරනු ලැබිය යුතු තේරීම් කාරක සභාවක නිර්දේශය මත විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිවරයකු පත් කරනු ලැබිය යුතු ය. නියෝජ්‍ය උපකුලපතිවරයා පත් කරනු ලැබීමෙන් පසු ඔහු උපකුලපතිවරයාගේ විධානය යටතේ විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු ලෙස කටයුතු කළ යුතු ය. නියෝජ්‍ය උපකුලපතිවරයකු සිටී නම් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් ඔහුගේ කාර්ය සහ කර්තව්‍ය තීරණය කළ යුතු ය.

පීඨයක පීඨාධිපතිවරයා

**13.** (1) එක් එක් පීඨයකට එම පීඨයේ අධ්‍යයන සහ පරිපාලන ප්‍රධානියා විය යුතු පීඨාධිපතිවරයකු සිටිය යුතු ය. එම පීඨයේ සාමාජිකයන් වන ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු, සහාය මහාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු අතුරින් පීඨාධිපතිවරයා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) පීඨාධිපතිවරයා විසින් යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට යටත් ව ඔහුව තෝරා පත්කර ගනු ලැබූ දින සිට ගණන් ගැනෙන අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, ඔහු එම ධුරය දැරීමට නුසුදුසු වුවහොත් මිස නැවත තෝරා පත් කරගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය. එසේ වුව ද කිසිම අවස්ථාවක ඔහු අනුක්‍රමික කාලසීමා දෙකක් සඳහා ධුර නොදැරිය යුතු ය.

(3) මේ පනතේ 59 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ නිලධරයකු වශයෙන් නොකඩවා කටයුතු කිරීමට නුසුදුස්සකු වන පීඨයක පීඨාධිපතිවරයා, එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) නිවාඩු ලබා නොපැමිණීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට නොවැඩි කාලයක් සඳහා යම් පීඨයක පීඨාධිපතිවරයකුට සිය ධුරයේ කාර්ය තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, එම කාලසීමාව සඳහා පීඨාධිපතිවරයා වශයෙන් වැඩ බැලීමට උපකුලපතිවරයා විසින් එම පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු පත් කරනු ලැබිය යුතු ය.

(5) පීඨයක පීඨාධිපතිවරයා ඉවත් කරනු ලැබූ විට, විශ්‍රාම ගිය විට හෝ ඉල්ලා අස්වූ විට හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස තුනකට වැඩි කාලයක් ඔහුට සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, එම පීඨයේ පීඨාධිපති ධුරය පුරප්පාඩු වී ඇති ලෙස සළකනු ලැබිය යුතු අතර, එවිට (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව නව පීඨාධිපතිවරයකු තෝරාපත් කර ගත යුතු ය. එසේ තෝරාපත්කර ගනු ලබන තැනැත්තා ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

**14.** (1) විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය නියමාවලියක් මගින් සංයුතිය නියම කරනු ලැබිය යුතු තේරීම් කාරක සභාවක නිර්දේශය මත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා තෝරා පත්කර ගත යුතු අතර, ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු ලෙස කටයුතු කළ යුතු ය. ලේඛකාධිකාරීවරයා විශ්වවිද්‍යාලයේ සහකාර ගිණුම් නිලධරයා ද විය යුතු ය. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා.

(2) ලේඛකාධිකාරීවරයා විසින්—

(අ) උපකුලපතිවරයාගේ විධානයට හා පාලනයට යටත්ව විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සහ එහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු ය;

(ආ) විශ්වවිද්‍යාලයේ වාර්තාවල සහ දේපළවල භාරකාරත්වය සම්බන්ධයෙන් වගකිව යුතු ය; සහ

(ඇ) මේ පනත මගින් හෝ යම් උචිත සාධනපත්‍රයක් මගින් ලේඛකාධිකාරීවරයා වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම ද කළ යුතු ය.

අධ්‍යක්ෂ, මාධ්‍ය සහ තොරතුරු සේවා.

**15.** (1) විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නියාමාවලියක් මගින් නියම කරනු ලැබිය යුතු සංයුතියක් සහිත තේරීම් කාරක සභාවක නිර්දේශය මත විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, මාධ්‍ය සහ තොරතුරු සේවා පත් කරනු ලැබිය යුතු අතර, ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු ලෙස කටයුතු කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා-

(අ) උපකුලපතිවරයාගේ විධානයට සහ පාලනයට යටත් ව විශ්වවිද්‍යාලයේ මාධ්‍ය හා තොරතුරු මධ්‍යස්ථානයේ නැතහොත් මධ්‍යස්ථානවල සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතු ය; සහ

(ආ) මේ පනත මගින් හෝ යම් උචිත සාධනපත්‍රයක් මගින් එම අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලබන හෝ පනවනු ලබන හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

අධ්‍යක්ෂ, මුදල්.

**16.** (1) නියමාවලියක් මගින් නියම කරනු ලැබිය යුතු සංයුතියක් සහිත තේරීම් කාරක සභාවක නිර්දේශය මත විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, මුදල් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු වශයෙන් කටයුතු කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ, මුදල්-

(අ) උපකුලපතිවරයාගේ විධානවලට සහ පාලනයට යටත් ව විශ්වවිද්‍යාලයේ මුදල්වල සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතු අතර, ඔහු විසින් නියමාවලියක් මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකට සහ ආකාරයට අනුව විශ්වවිද්‍යාලයේ ගිණුම් පවත්වාගෙන යා යුතු ය; සහ

(ආ) මේ පනත මගින් හෝ යම් උචිත සාධනපත්‍රයක් මගින් අධ්‍යක්ෂ, මුදල් වෙත පවරනු ලැබූ හෝ පනවනු ලැබූ හෝ වෙන්කර දී ඇති බලතල කාර්ය සහ කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ, මුදල් විශ්වවිද්‍යාලයේ සියලුම අරමුදල්වල භාරකාරත්වය දැරිය යුතු ය.

17. (1) විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින්, නියමාවලියක් මගින් නියම කරනු ලැබිය යුතු සංයුතියක් සහිත තේරීම් කාරක සභාවක නිර්දේශය මත විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව තනතුර දරන තැනැත්තා පත්කරනු ලැබිය යුතු අතර, එම අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු වශයෙන් කටයුතු කළ යුතු ය. අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව.

(2) අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව තනතුර දරන තැනැත්තා-

(අ) උපකුලපතිවරයාගේ විධානයට හා පාලනයට යටත්ව ඇතුළත් කිරීමේ නිර්නායක සඳහා ද, පාඨමාලාවල තත්ත්ව සහතික කිරීම් සඳහා ද, විශ්වවිද්‍යාලය මගින් සලසනු ලබන වෙනත් සහායක සේවා සඳහා ද වගකිව යුතු ය; තව ද

(ආ) මේ පනත මගින් හෝ යම් උචිත සාධනපත්‍රයක් මගින් හෝ එම අධ්‍යක්ෂවරයා වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම ද කළ යුතු ය.

V වන කොටස

**විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල**

18. විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල වනුයේ පහත දැක්වෙන බලමණ්ඩලයන් ය:— විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල.

(අ) පාලන මණ්ඩලය;

(ආ) ඇතුළත් කිරීම්, ප්‍රතීනත සහ තත්ත්ව සහතික කිරීම් සභාව;

(ඇ) ශාස්ත්‍රීය සභාව;

(ඈ) පීඨ මණ්ඩල; සහ

(ඉ) විශ්ව විද්‍යාලයේ බලමණ්ඩල බවට නියමාවලි මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් මණ්ඩල.

විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලය.

**19.** (1) (මේ පනතේ මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්:—

(i) උපකුලපතිවරයා;

(ii) නියෝජ්‍ය උපකුලපතිවරයකු සිටී නම් ඔහු;

(iii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා;

(iv) යම් නියාමාවලියක් යටතේ පිහිටුවනු ලැබූ එක් එක් ආයතනයේ අධ්‍යක්ෂවරයා;

(v) නිපුණතා සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(vi) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(vii) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(viii) නාවික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(ix) විද්‍යා හා තාක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(x) ධීවර හා ජලජ සම්පත් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(xi) එක් එක් මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයකු සිටී නම් ඔහු;

(xii) 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා;

(xiii) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන පනත මගින් පිහිටුවන ලද ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සභාපතිවරයා;

(xiv) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ සභාපතිවරයා; සහ

(xv) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා; සහ

(ආ) (මේ පනතේ පත්කළ "සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් තැනැත්තන්:—

(i) ශාස්ත්‍රීය සභාව විසින්, එම සභාවේ සාමාජිකයන් අතුරින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්;

(ii) ඉංජිනේරු, විද්‍යා හා කළමනාකරණ යන ක්ෂේත්‍රවල වෘත්තීමය මණ්ඩල නියෝජනය කරන එක් සාමාජිකයෙක් බැගින්;

(iii) අධ්‍යාපන, වෘත්තීයමය සහ පරිපාලන ක්ෂේත්‍රවලට විශිෂ්ට සේවයක් ඉටු කර ඇති තැනැත්තන් අතරින් තිදෙනෙක්.

(2) මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම මුලසුන දැරිය යුතු උපකුලපතිවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය. සභාපතිවරයාට යම් රැස්වීමක දී මුලසුන දැරීමට නොහැකි වන්නේ නම්, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් යම් අයෙකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරාපත් කර ගත යුතු ය. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතු ය.

(3) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු, ඔහු කළින් ධුරය අත්හලහොත් මිස, ඔහු පත්කළ දින සිට ගණන් ගැනෙන පරිදි අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත්කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය:

එසේ වුව ද, යම් පත්කළ සාමාජිකයකු සිය ධුර කාලය ඉකුත් වීමට පෙරාතුව ධුරය අත්හලහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඔහු අනුප්‍රාප්ත වන තැනැත්තාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී, ඉතිරිව ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(4) මණ්ඩලයේ පත්කළ සාමාජිකයකු ඔහුගේ අත්සන යටතේ අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මේ පනතේ 59 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ බලමණ්ඩලයක සාමාජිකයකු ලෙස නොකඩවා කටයුතු කිරීමට නුසුදුස්සකු වන මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු, ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලයේ පත්කළ සාමාජිකයකු කවර හෝ හේතුවක් නිසා මණ්ඩලයේ අනුයාත රැස්වීම් තුනකට නොපැමිණි අවස්ථාවක, ඔහු සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුරය අත්හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එසේ ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ පත්කළ සාමාජිකයකුට මුදල් විෂයයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනා ගෙවනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(9) මණ්ඩලය අවශ්‍ය කවර හෝ අවස්ථාවන් හි දී රැස්විය යුතු අතර, එසේ වුව ද, එක් එක් වර්ෂයක දී යටත් පිරිසෙයින් රැස්වීම් දහයක් පැවැත්විය යුතු ය.

(10) මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවශ්‍ය යයි ඔහු සලකනු ලබන කවර හෝ අවස්ථාවල දී හෝ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නො අඩු සාමාජික සංඛ්‍යාවක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් සභාපතිවරයා වෙත ලැබී සතියක් ඇතුළත මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**20.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත මගින් විශ්වවිද්‍යාලයට පවරා ඇති හෝ පනවා ඇති හෝ වෙන්කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් මණ්ඩලය වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම කළ යුතු ය:—

(අ) ශාස්ත්‍රීය සභාව විසින් නිර්දේශ කරනු ලබන අධ්‍යයන පාඨමාලා අනුමත කිරීම;

(ආ) ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව විසින් කරනු ලබන නිර්දේශ සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සඳහා වූ අවශ්‍යතා, කලින් කළ, තීරණය කිරීම;

(ඇ) විශ්වවිද්‍යාලයේ දේපල සහ අරමුදල් දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම;

(ඈ) විශ්වවිද්‍යාලය සඳහා කුල ලාංඡනයක් තෝරා ගැනීම සහ එහි ආකෘතිය නිශ්චය කිරීම;

(ඉ) මේ පනතේ හෝ යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට අනුකූලව විශ්වවිද්‍යාලයට අදාළ සියලු කාරණා නියාමනය කිරීම සහ නිශ්චය කිරීම;

(ඊ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය අවශ්‍යතා පිළිබඳව, කළින් කළ, විමසීම හෝ විමර්ශනය කිරීම;

(උ) එක් වරකට අවුරුදු තුනකට නොඅඩු කාලයක් සඳහා විශ්වවිද්‍යාලය සඳහා සංයුක්ත ක්‍රමෝපාය සැලසුම් සහ අනුරූප අයවැය, කළින් කළ, පිළියෙල කිරීම;

(ඌ) රජයේ සමස්ත වැටුප් හා වේතන ප්‍රතිපත්ති ඇතුළත විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය සහ ඔවුන්ට ලැබීමට හිමිකම් ඇති වෙනත් ප්‍රතිලාභ, කළින් කළ නිශ්චය කිරීම;

(එ) නිශ්චිත කාර්ය සඳහා විශ්වවිද්‍යාලය විසින් වියදම් කිරීම සඳහා ලබා දී ඇති යම් අරමුදල් පරිපාලනය කිරීම;

(ඒ) රික්තවරණ, පරිත්‍යාග, ප්‍රදාන හෝ අන්‍යකාරයකට විශ්වවිද්‍යාලය වෙත ලබා දී ඇති දේපල භාරගැනීම සහ පිළිගැනීම;

(ඔ) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් සළකා බැලීම සහ එම වාර්තාව සහ ගිණුම් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි සංශෝධන ද සහිතව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ඕ) විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මූල්‍ය විසර්ජන පිළියෙල කර ඒවා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ක) මේ පනත යටතේ ප්‍රඥප්ති සෑදීමට නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය වූ විට එම ප්‍රඥප්ති සකස් කිරීම;

(ග) මේ පනත යටතේ අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය පවරා ඇති කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සෑදීම;

(ච) විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ගෘහ භාණ්ඩ, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය ලබා දීම;

(ජ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ තැනැත්තන්ගේ කාර්ය සාධනය ඇගයීම;

(ට) ශාස්ත්‍රීය සභාව විසින් කරනු ලබන යම් නිර්දේශ සළකා බැලීමෙන් පසු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය අතරින් හෝ පිටස්තර ස්ථානයකින් විභාග පරීක්ෂකයන් පත්කිරීම සහ ඔවුන්ට ගෙවිය යුතු ගාස්තු නිශ්චය කිරීම;

(ඩ) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ සාමාන්‍ය සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශිෂ්‍යයන්ගේ නියෝජිතයකු ද ඇතුළත් විය යුතු සුභසාධක මණ්ඩලයක් පත් කිරීම, එම මණ්ඩලයේ සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය;

(ණ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් සඳහා විනය පවත්වාගෙන යාම සඳහා සහ ඔවුන්ට නේවාසික පහසුකම් සැලසීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ශිෂ්‍යයන්ගේ නියෝජිතයකු ද ඇතුළත් විය යුතු නේවාසික හා විනය මණ්ඩලයක් පත් කිරීම සහ එම මණ්ඩලයේ සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය;

(ත) විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත් වීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒවා අවලංගු කිරීම සහ විශ්වවිද්‍යාලය වෙත ජනනය වන යම් කටයුත්තක් සඳහා යොදවාගෙන නොමැති ආදායම් ඇතුළු විශ්වවිද්‍යාලයට අයත් යම් මුදල් ශ්‍රී ලංකාවේ නිශ්චල දේපල මිලදී ගැනීම හෝ එවැනි වෙනත් ආයෝජන සඳහා යෙදවීම හෝ එම මුදල්වලින් වියදම් සඳහා වහාම අවශ්‍ය නොවන යම් මුදල් කොටසක් මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් බැංකුවක ස්ථිර තැන්පතු වශයෙන් තැන්පත් කිරීම;

(ද) ශාස්ත්‍රීය සභාව විමසීමෙන් පසු උපකුලපතිවරයාගේ නිලධරයන්ගේ, උපාධිධාරීන්ගේ, සහ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ නේපථ්‍යය හෝ ලාංඡනය නැතහොත් ඒ දෙකම නිශ්චය කිරීම;

(න) ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව විමසා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පදවි, මහාචාර්ය පදවි, සහාය මහාචාර්ය පදවි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පදවි, කථිකාචාර්ය පදවි, සහ සහකාර කථිකාචාර්ය පදවි ඇති කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම;

(ප) ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව විමසා යම් අනධ්‍යන තනතුරක් ඇති කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම;

(බ) ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව විමසා (xxi) සහ (xxii) යන ඡේදවල සඳහන් යම් ධුරයක් සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම;

(ම) විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ කාර්ය සඳහා රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ආයතන සමග සහයෝගීතා සහ හවුල් ව්‍යාපාර පිහිටුවා ගැනීම;

(ය) ශාස්ත්‍රීය සභාව විසින් නිර්දේශ කරනු ලැබිය හැකි යම් පීඨ, ශාස්ත්‍රීය අංශ, අධ්‍යයන අංශ, ඒකක හෝ මධ්‍යස්ථාන සංඛ්‍යාවක් පිහිටුවීම;

(අඅ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි යම් සංවිධානයක කළමනාකරණ මණ්ඩලයේ සේවය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ නිලධරයන්ට, ස්ථිර කාර්ය මණ්ඩලයට හෝ විශ්වවිද්‍යාල මණ්ඩලයේ යම් සාමාජිකයන්ට අවසර දීම සහ ආදායම් උපදින කටයුතු භාර ගැනීම සඳහා සහ දැනුම වාණිජකරණය කිරීම සඳහා පමණක් සමාගම් පනත යටතේ ලියපදිංචි වී ඇති යම් ආයතනයක උපදේශක සේවා සඳහා දායකවීමට අවසරදීම. එසේ වුව ද, එම ආයතනයේ ලාභ කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයන්ගේ සංවර්ධනය හා සුභසාධනය සඳහා විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කළ යුතු ය;

මෙම ඡේදයේ කාර්ය සඳහා "විශ්වවිද්‍යාල මණ්ඩලය" යන්නෙන් පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන සුභසාධක මණ්ඩලය සහ නේවාසික සහ විනය මණ්ඩලය ද ඇතුළු යම් විශ්වවිද්‍යාල මණ්ඩලයක් අදහස් වේ,

(ආආ) නියෝජ්‍ය උපකුලපතිවරයකු සිටී නම් ඔහුගේ කාර්ය සහ කර්තව්‍ය නිශ්චය කිරීම සහ ඒවා ඔහුට පැවරීම.

(ඇඇ) ශාස්ත්‍රීය සභාවේ නිර්දේශය මත අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම; සහ

(ඈ) විශ්වවිද්‍යාලයේ යම් බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ පනතෙහි හෝ වෙනත් යම් උචිත සාධනපත්‍රයක අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා නොමැති, වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(3) යම් යෝජනා සම්මතයක් පිළිබඳව ස්වකීය මතය මණ්ඩලය වෙත වාර්තා කිරීමේ සහ ප්‍රේෂණය කිරීමේ අවස්ථාවක් ශාස්ත්‍රීය සභාව වෙත පළමුවෙන් ලබා දී ඇත්නම් මිස, යම් ශාස්ත්‍රීය කාරණයක් සම්බන්ධව හෝ කිසිදු යෝජනා සම්මතයක් මණ්ඩලය විසින් සම්මත කරගනු නොලැබිය යුතු ය.

මේ වගන්තියේ "ශාස්ත්‍රීය කාරණයක්" යන්නෙන් ශාස්ත්‍රීය සභාවේ පාලනයට සහ සාමාන්‍ය විධානයට යටත් වන යම් කාරණයක් අදහස් වේ.

නියමාවලි සෑදීමට මණ්ඩලයට ඇති බලතල.

**21.** (1) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව මණ්ඩලය විසින් පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් නියමාවලි සාදනු ලැබිය හැකි ය:—

(අ) නියම කිරීම සඳහා නියමාවලි මගින් නියම කර ඇති සියලු කාරණා හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ මණ්ඩලය විසින් නියමාවලි සෑදීමට බලය පවරා ඇති කාරණා සම්බන්ධයෙන්;

(ආ) අදාළ ක්ෂේත්‍රයන්හි වෘත්තීය පුහුණු සඳහා ආයතනයන් හි ප්‍රමිතීන් ඇතිකිරීම සහ පවත්වාගෙන යාම;

(ඇ) විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයන්ගේ සේවය පිළිබඳ නියම හා කොන්දේසි;

(ඈ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි;

(ඉ) උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ උපදේශක ප්‍රමිති පිහිටුවීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ඊ) විදේශීය උපාධි සහ ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිගැනීම; සහ

(උ) ඉහත සඳහන් කාරණාවලට සම්බන්ධ හෝ ආනුෂංගික වන වෙනත් යම් කාරණයක්.

(3) මේ පනත යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන සෑම නියමාවලියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එහි සඳහන් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව.

**22.** (1) (මෙහි මින්මතු "තත්ත්ව සහතික කිරීම් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්:—

(i) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා;

(ii) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(iii) තත්ත්ව සහතික කිරීම් සභාවේ අධ්‍යක්ෂවරයා;

(iv) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා;

(v) තාක්ෂණික විද්‍යාලවල කටයුතු විධිමත් කිරීම් වගකීම පවරා ඇති මණ්ඩලයේ ප්‍රධානයා; සහ

(ආ) (මෙම වගන්තියේ "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) උපකුලපතිවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන තැනැත්තන් :—

(i) ධීවර සහ සාගර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණවේද සහ සමාන ක්ෂේත්‍රවල සාමාජිකයන් තිදෙනෙකුගේ

උපරිමයකට යටත් ව එම ක්ෂේත්‍රවල වෘත්තීමය මණ්ඩලවලින් තෝරාගනු ලබන එක් නියෝජිතයෙක් බැගින්;

(ii) ධීවර හා සාගර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණවේදය සහ සමාන ක්ෂේත්‍රවලට අදාළ විශ්වවිද්‍යාලවලින් එක් විශ්වවිද්‍යාලීය ශාස්ත්‍රවේදියකු බැගින් පීඨවල පීඨාධිපතිවරුන් අතරින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්;

(iii) ශාස්ත්‍රීය සභාව විසින් එහි සාමාජිකයන් අතුරින් නම් කරනු ලබන එම සභාවේ නියෝජිතයන් තිදෙනෙක්; සහ

(iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීම් සභාවේ අධ්‍යක්ෂවරයා සහ 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීමය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීමය අධ්‍යාපන කොමිෂන් සභාවේ ජාතික වෘත්තීය සුදුසුකම් සහ ප්‍රතීතනය සඳහා වගකිවයුතු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්.

(2) තත්ත්ව සහතික කිරීම් සභාවේ සභාපතිවරයා එක් එක් පීඨයේ පීඨාධිපතිවරුන් අතරින් තෝරා පත්කර ගත යුතු අතර, ඔහු එම සභාවේ සියලු රැස්වීම්වල දී මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක දී මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් රැස්වීමේ මුලසුන දැරීම සඳහා ඔවුන් අතුරින් යම් අයෙකු තෝරා පත්කර ගත යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා තත්ත්ව සහතික කිරීම් සභාවේ ලේකම්වරයා විය යුතු ය.

(4) තත්ත්ව සහතික කිරීම් සභාවේ රැස්වීමක ගණපූරණය එහි සම්පූර්ණ සාමාජිකත්වයෙන් හරි අඩක් විය යුතු අතර, එම සභාව අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී රැස්විය යුතු ය. එසේ වුව ද එම සභාව එක් එක් වර්ෂයේ දී යටත් පිරිසෙයින් එක් අවස්ථාවක දී හෝ රැස්විය යුතු ය.

(5) තත්ත්ව සහතික කිරීම් සභාවේ පත්කළ සාමාජිකයකු කලින් ධුරය අත්හළහොත් මිස, ඔහු පත්කළ දින සිට ගණන් ගැනෙන පරිදි

අවුරුදු හතරක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය:

එසේ වුව ද, යම් පත් කළ සාමාජිකයකු සිය ධුර කාලය අවසන් වීමට පෙරාතුව ධුරය අත්හළහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු සඳහා ද එම සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(6) තත්ත්ව සහතික කිරීම් සභාවේ යම් පත්කළ සාමාජිකයකු තම අත්සන යටතේ උපකුලපතිවරයා අමතන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(7) මේ පනතේ 59 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ යම් බල මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් නොකඩවා කටයුතු කිරීමට නුසුදුස්සකු වන තත්ත්ව සහතික කිරීමේ සභාවේ යම් පත්කළ සාමාජිකයකු එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(8) කවර හෝ හේතුවක් නිසා තත්ත්ව සහතික කිරීම් සභාවේ අනුයාත රැස්වීම් තුනකට සහභාගී නොවන එම සභාවේ පත් කළ සාමාජිකයකු, සාමාජිකයකු වශයෙන් තම ධුරය අත්හැර ඇති ලෙස සළකනු ලැබිය යුතු අතර, උපකුලපතිවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එසේ ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(9) තත්ත්ව සහතික කිරීම් සභාවේ පත්කළ සාමාජිකයකුට අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන දීමනා ගෙවනු ලැබිය හැකි ය.

තත්ත්ව සහතික කිරීමේ සභාවේ බලතල.

**23.** පහත දැක්වෙන කාරණා පිළිබඳව වූ යම් උචිත වාර්තා සළකා බැලීමෙන් පසු තත්ත්ව සහතික කිරීම් සභාව විසින් ඒ සම්බන්ධයෙන් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට බලය ඇත්තේ ය:—

(අ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා සඳහා වූ ඇතුළත් කර ගැනීමේ නිර්නායක:

එසේ වුව ද, යම් අයදුම්කරුවන් ප්‍රභේදයක් ඇතුළත් කර ගැනීම සඳහා වන යම් යෝග්‍යතා පරීක්ෂණයක් විභාග දෙපාර්තමේන්තුව විසින්, විශ්වවිද්‍යාලය විමසා පවත්වනු ලැබිය යුතු ය;

(ආ) එක් එක් අධ්‍යයන පාඨමාලාව සඳහා ඇතුළත් කරගත යුතු ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ඇ) විශ්වවිද්‍යාලයේ දී අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළුවීම සඳහා සපුරාලිය යුතු බවට නියම කර ඇති රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකින් ලබා දෙන හෝ ප්‍රදානය කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහ වෙනත් යම් වෘත්තීය සුදුසුකම් අතරින් තෝරාගනු ලැබූ සුදුසුකම්;

(ඈ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ ඔවුනට උසස්වීම් ලබා දීම පිළිබඳ නිර්නායක;

(ඉ) පාඨමාලාවල ශාස්ත්‍රීය තත්ත්වය පවත්වාගෙන යාම හෝ ඉහළ දැමීම සඳහා අදාළ වන යම් කාරණාවක්;

(ඊ) ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පදවි, මහාචාර්ය පදවි, සහාය මහාචාර්ය පදවි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පදවි, කථිකාචාර්ය පදවි සහ සහකාර කථිකාචාර්ය පදවි ස්ථාපිත කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම;

(උ) ශාස්ත්‍රීය සභාව හා අදාළ පරදු දරන්නන් විමසා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලාවල ප්‍රතීතන අවශ්‍යතා සකස් කිරීම;

(ඌ) විශ්වවිද්‍යාලයේ සියලු ගුරුවරුන්ගේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා;

(එ) විශ්වවිද්‍යාලයේ අරමුණු වැඩිදියුණු කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන සමග සහ වෘත්තීයමය මණ්ඩල සමග ඇති කරගත යුතු සම්බන්ධතා;

(ඒ) කමිටුවල බලතල සම්බන්ධ කාරණා පිළිබඳ පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා සභාවට අවශ්‍ය යයි තත්ත්ව සහතික කිරීම් සභාව විසින් සලකනු ලැබිය හැකි ස්වකීය සාමාජිකයන්ගෙන් සහ ස්වකීය සාමාජිකත්වයෙන් පරිබාහිර වෙනත් පිටස්තර වෘත්තීය සාමාජිකයන්ගෙන් සමන්විත වන යම් කමිටු සංඛ්‍යාවක් පත් කිරීම; සහ

(ඔ) නිර්දේශ කිරීම සඳහා මණ්ඩලය විසින් තත්ත්ව සහතික කිරීම් සභාව වෙත යොමු කරනු ලබන වෙනත් යම් කාරණයක්.

ශාස්ත්‍රීය සභාව.

**24.** (1) ශාස්ත්‍රීය සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. එනම්—

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්:—

(i) උපකුලපතිවරයා;

(ii) නියෝජ්‍ය උපකුලපතිවරයකු සිටී නම් ඔහු;

(iii) එක් එක් පීඨයේ පීඨාධිපති;

(iv) විශ්වවිද්‍යාලය යටතේ පිහිටුවන ලද එක් එක් මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයා සහ එක් එක් ආයතනයේ අධ්‍යක්ෂවරයා;

(v) විශ්වවිද්‍යාලයේ සෑම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු සහ මහාචාර්යවරයකු;

(vi) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා;

(vii) විභාග භාරව කටයුතු කිරීම සඳහා නම් කොට ඇති නිලධරයා;

(viii) අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා;

(ix) අධ්‍යක්ෂ, තත්ත්ව සහතික කිරීම් සභාව;

(x) විශ්වවිද්‍යාලයේ එක් එක් ශාස්ත්‍රීය අධ්‍යයන අංශවල ප්‍රධානීන්.

(ආ) පහත දැක්වෙන තෝරාපත් කරගනු ලබන සහ පත් කළ සාමාජිකයන්:—

(i) එක් එක් පීඨයේ ස්ථිර ගුරුවරුන් විසින් ඔවුන් අතුරින් තෝරා පත්කර ගනු ලබන එක් එක් පීඨයෙන් නියෝජිතයන් හත්දෙනෙකුට වැඩි නොවන සහාය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් යම් සංඛ්‍යාවක්;

(ii) එක් එක් පීඨය නියෝජනය කිරීම සඳහා පීඨ මණ්ඩලය විසින් තෝරා පත්කර ගනු ලබන සහ පීඨ ප්‍රමාණයට සමාන වන කථිකාචාර්යවරුන් සංඛ්‍යාවක්; සහ

(iii) අධ්‍යාපන, වෘත්තීයමය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලන යන ක්ෂේත්‍රවල විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතුරින් අදාළ පීඨ මණ්ඩල විසින් නිර්දේශ කරනු ලබන පරිදි මණ්ඩලය විසින් පත් කරනු ලබන පීඨ සංඛ්‍යාවට සමාන සාමාජිකයන් සංඛ්‍යාවක්.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන එක් එක් සාමාජිකයකු අවස්ථාවෝචිත පරිදි එම තෝරා පත්කර ගැනීමේ හෝ පත් කිරීමේ දින සිට ගණන් ගැනෙන පරිදි අවුරුදු දෙකක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

(3) ශාස්ත්‍රීය සභාවේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය එහි සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(4) අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී ශාස්ත්‍රීය සභාව රැස්විය යුතු නමුත්, එක් එක් වර්ෂයේ අවස්ථා දහයකට නොඅඩු අවස්ථා ගණනක් එම සභාව රැස්විය යුතු ය.

(5) ශාස්ත්‍රීය සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු, උපකුලපතිවරයා එම ශාස්ත්‍රීය සභාවේ සභාපතිවරයා විය යුතු ය. යම් රැස්වීමක මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වන්නේ නම්, නියෝජ්‍ය උපකුලපතිවරයකු සිටින්නේ නම්, ඔහු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. නියෝජ්‍ය උපකුලපතිවරයකු නොමැති නම්, පැමිණ සිටින සාමාජිකයන් විසින්, එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයන් අතුරින් යම් අයකු තෝරා පත්කර ගත යුතු ය.

ශාස්ත්‍රීය සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**25.** (1) ශාස්ත්‍රීය සභාව විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අධිකාරය විය යුතු අතර, එම සභාවට, මේ පනතේ විධිවිධානවලට සහ යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට යටත්ව විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ ප්‍රමිතිය, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් ශාස්ත්‍රීය සභාව වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව, ශාස්ත්‍රීය සභාව විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය:—

(i) අධ්‍යයන පාඨමාලා සහ විභාග විධිමත් කිරීමේ ක්‍රම පිළිබඳව යම් පීඨයක් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සැලකිල්ලට ගෙන මණ්ඩලයට උපදෙස් දීම සහ එවැනි අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ii) යම් පීඨයක් හෝ පීඨ මගින් ඉදිරිපත් කරන ලද වාර්තා සළකා බැලීමෙන් පසු විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තන්ගේ නම් පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(iii) විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පදවි, මහාචාර්ය පදවි සහාය මහාචාර්ය පදවි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පදවි, කථිකාචාර්ය පදවි සහ සහකාර කථිකාචාර්ය පදවි ස්ථාපිත කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීමට අදාළ යම් යෝජනා පිළිබඳව පීඨ මණ්ඩලයක් මගින් ඉදිරිපත් කරනු ලබන

යම් ඉල්ලීමක් ඇගයීමට ලක් කිරීම සහ ඒ පිළිබඳව තත්ත්ව සහතික කිරීම් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(iv) (අ) දැනට පවත්නා පීඨ ප්‍රතිසංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම; සහ

(ආ) අධ්‍යයන විෂයයන් අදාළ පීඨ වෙත පැවරීමේ යෝජනා ක්‍රම;

පිළිබඳව යම් පීඨයක් හෝ පීඨ මගින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සළකා බැලීමෙන් පසු මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(v) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා නියම කරනු ලබන තරගය පිළිබඳ ක්‍රමවේදය සහ කොන්දේසිවලට අදාළ කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(vi) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණ, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(vii) විශේෂයෙන් පහත දැක්වෙන කමිටු ද ඇතුළුව ශාස්ත්‍රීය සභාව විසින් අවශ්‍ය යයි සළකනු ලබන ශාස්ත්‍රීය සභාවේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ස්ථාවර කාරක සභා හෝ යථායෝග්‍ය කාරක සභා හෝ මණ්ඩල යම් සංඛ්‍යාවක් පත් කිරීම, එනම්—

(අ) මාධ්‍ය සහ තොරතුරු සේවා කමිටුව;

(ආ) පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව;

(ඇ) කර්මාන්ත - විශ්වවිද්‍යාල හවුල් ව්‍යාපාර කමිටුව;

(ඈ) විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව;

(ඉ) නිවාඩු හා ප්‍රදාන කමිටුව;

(ඊ) ප්‍රාදේශීය කමිටුව;

(viii) (vii) වන ඡේදය යටතේ පත් කරනු ලබන කමිටුවල සහ මණ්ඩලවල තීර්ණය විෂයයන් නිශ්චිතව දැක්වීම සහ එවැනි යම් කාරක සභා හෝ මණ්ඩල විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සංශෝධන සහිතව හෝ රහිතව අනුමත කිරීම හෝ එම වාර්තා ප්‍රතික්ෂේප කිරීම;

(ix) යම් අධ්‍යයන පාඨමාලාවකට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට අදාළව පීඨ මණ්ඩලයක් විසින් කරන ලද යෝජනා සහ ඒ පිළිබඳ ඔවුන්ගේ නිරීක්ෂණ තත්ත්ව සහතික කිරීමේ සභාව වෙත යොමු කිරීම; සහ

(x) ඉගැන්වීමේ, පර්යේෂණ සහ ව්‍යාප්ති වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යයි සළකනු ලබන යම් පීඨ පිහිටුවීම සම්බන්ධයෙන්, කලින් කල, මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

පීඨ මණ්ඩලය.

**26.** (1) විශ්වවිද්‍යාලයේ යම් පීඨයක පීඨ මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) පීඨයේ පීඨාධිපතිවරයා;

(ආ) එක් එක් ශාස්ත්‍රීය අධ්‍යයන අංශයේ ප්‍රධානයා;

(ඇ) පීඨයේ සිටින සියලු ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු, සහාය මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සහ කථිකාචාර්යවරු;

(ඈ) අධ්‍යක්ෂ, තත්ත්ව සහතික කිරීම් සභාව හෝ ඔහුගේ නාමිකයෙක්;

(ඉ) අධ්‍යක්ෂ, මාධ්‍ය හා තොරතුරු සේවා හෝ ඔහුගේ නාමිකයෙක්;

(ඊ) (ඇ) ඡේදයේ සඳහන් තැනැත්තන් හැර, ස්ථිර කාර්ය මණ්ඩලය විසින් ඔවුන් අතුරින් තෝරාපත් කරගනු ලබන පීඨයේ ඉගැන්වීම් කටයුතුවල නියැලී සිටින ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක්;

(උ) පීඨයේ ශිෂ්‍යයන් විසින් ඔවුන් අතුරින් තෝරා පත්කර ගනු ලබන ශිෂ්‍යයන් දෙදෙනෙක්:

එසේ වුව ද, මේ පනතේ 13 වන වගන්තිය යටතේ පීඨාධිපතිවරයා තෝරා පත්කර ගැනීමට අදාළ සහ විභාග සහ සම්බන්ධිත කාරණාවලට අදාළ පීඨ මණ්ඩලයේ යම් රැස්වීමක කටයුතුවලින් මේ ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් ඉවත්ව සිටිය යුතු අතර, එම තැනැත්තන් ඉවත්ව සිටීම නොතකා එවැනි යම් රැස්වීමක් යථාපරිදි පවත්වනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය; සහ

(ඌ) අදාළ පීඨයට සම්බන්ධතා ඇති අධ්‍යයන ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයක් දක්වා ඇති තැනැත්තන් අතුරින් පීඨය විසින් නම් කරනු ලබන සහ විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් පස් දෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයන්, සාමාජිකයකු වශයෙන් අවුරුදු එකක කාලයක් ධුර දැරිය යුතු අතර, තෝරා පත්කර ගනු ලැබූ අනෙක් සියලු සාමාජිකයන් තමා තෝරා පත්කර ගනු ලැබූ දින සිට ගණන් ගැනෙන පරිදි අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

(3) පීඨ මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු පීඨයේ පීඨාධිපතිවරයා, පීඨ මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය. පීඨයේ පීඨාධිපතිවරයාට එවැනි යම් රැස්වීමක මුලසුන දැරීමට නොහැකි වන අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයකු හැර, එසේ පැමිණ සිටින සාමාජිකයන් අතුරින් යම් අයකු රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(4) පීඨ මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු අතර, අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී පීඨ මණ්ඩලය රැස්විය යුතු ය. එසේ වුව ද, පීඨ මණ්ඩලය එක් එක් වර්ෂයේ අවස්ථා දහයකට නොවැඩි අවස්ථා ගණනක දී රැස්විය යුතු ය.

පීඨ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**27.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, පීඨ මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය:—

(අ) ශාස්ත්‍රීය සභාව විසින්, පීඨ මණ්ඩලය වෙත යොමු කරන ලද යම් කාරණයක් පිළිබඳ සලකා බලා වාර්තා කිරීම;

(ආ) ශාස්ත්‍රීය සභාවේ පාලනයට යටත්ව, සමුද්‍ර සාගර විද්‍යාව, සමුද්‍රීය ඉංජිනේරු විද්‍යාව, ධීවර හා සාගර විද්‍යා හා කළමනාකරණය, තාක්ෂණ හා වෘත්තීය පුහුණු අධ්‍යනය සහ පුහුණුව යන විෂයන්ගේ විවිධ අංශ පිළිබඳව ඉගැන්වීමට, විභාග පැවැත්වීමට සහ පර්යේෂණ කිරීමට අදාළ කාරණා විධිමත් කිරීම;

(ඇ) පීඨයේ අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට සම්බන්ධ සියලු කාරණා පිළිබඳව ශාස්ත්‍රීය සභාවට නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම;

(ඈ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳව සළකා බලා වාර්තා කිරීමේ කාර්ය සඳහා පීඨයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම; සහ

(ඉ) විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් ශාස්ත්‍රීය සභාවට නිර්දේශ කිරීම.

## VI වන කොටස
### මණ්ඩප

මණ්ඩප පිහිටුවීම.

**28.** මණ්ඩලය විසින් (මෙහි මින්මතු "මණ්ඩප නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්—

(අ) විශ්වවිද්‍යාලයක මණ්ඩපයක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) ඒ මණ්ඩපයට නමක් හා අභිධානයක් පැවරිය හැකි ය;

(ඇ) ඒ මණ්ඩපය පිහිටා තිබිය යුතු ප්‍රදේශය හෝ භූමිභාගය නියම කළ හැකි ය;

(ඈ) ඒ මණ්ඩපයට පීඨයක් හෝ පීඨ පැවරිය හැකි ය; සහ

(ඉ) ඒ පීඨය හෝ පීඨ යම් අධ්‍යයන අංශවලින් සමන්විත විය යුත්තේ ද ඒ අධ්‍යයන අංශ නියම කොට දැක්විය හැකි ය.

**29.** (1) උපකුලපතිවරයා විසින් මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා පත් කරනු ලැබිය යුතු ය. ඔහු ධුර දැරීම කලින් අවසන් වුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දිනයේ සිට ගණන් ගැනෙන අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඉහත කී කාලයට ඉක්බිතිව ම එළඹෙන වැඩිදුරටත් වූ අවුරුදු තුනක කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය. මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා

(2) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා හෝ සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට මණ්ඩපාධිපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත් එසේ කටයුතු ඉටු කිරීමට නොහැකි වූ දින සිට දින හතක කාලයක් ඇතුළත ඒ ධුරයේ කටයුතු ඉටු කිරීම සඳහා උපකුලපතිවරයා විසින් සුදුසු යැයි සලකනු ලබන වැඩපිළිවෙලක් යෙදිය යුතු ය. එවැනි වැඩපිළිවෙලක් යොදන තෙක් ලේඛකාධිකාරීවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කාර්ය කරගෙන යා යුතු ය.

(3) මණ්ඩපාධිපතිවරයා, මණ්ඩපයේ පූර්ණ කාලීන නිලධරයකු වන අතර, මණ්ඩපයේ ශාස්ත්‍රීය හා පරිපාලන ප්‍රධානයා ද වන්නේ ය.

(4) මණ්ඩපාධිපතිවරයා මණ්ඩප සභාවේ සභාපතිවරයා වන්නේ ය.

**30.** (1) මණ්ඩපයට, එහි සංයුතිය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු, (මෙහි මින්මතු "මණ්ඩප සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවක් තිබිය යුතු ය. මණ්ඩප සභාව.

(2) මණ්ඩප සභාව—

(අ) මණ්ඩපයේ අභ්‍යන්තර පරිපාලනය;

(ආ) මණ්ඩපයේ අනුයුක්ත තැනැත්තන්ගේ සාමාන්‍ය ශුභසිද්ධිය සඳහා සහ ඔවුනට පහසුකම් සැලසීම සඳහා කටයුතු පිළියෙල කිරීම; සහ

(ඇ) ප්‍රඥප්ති මගින් නියම කරනු ලබන වෙනත් යම් කාර්යයක් ඉටු කිරීම,

සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(3) මණ්ඩප සභාව විසින්, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමතය ඇතිව, මණ්ඩපයේ අභ්‍යන්තර පරිපාලනය හා සම්බන්ධ හෝ ඊට ආනුශංගික හෝ සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

## VII වන කොටස
## විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය

විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම.

**31.** (1) විශ්වවිද්‍යාලය විසින් උපාධි ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා කුලපතිවරයා විසින් අනුමත කරනු ලබන යම් දිනයක හෝ දිනවල දී සෑම වර්ෂයකට ම එක් වරක් උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, කුලපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි විශ්වවිද්‍යාලය විසින් වෙනත් යම් අවස්ථාවක දී විශේෂ උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කවරක් සඳහන් වුව ද, ප්‍රථම උපාධි, උපාධි ප්‍රදානෝත්සවයක් නොපවත්වා ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්වීම සඳහා කාර්ය පටිපාටිය අතුරු ව්‍යවස්ථා මඟින් නියම කරනු ලැබිය යුතු ය.

(4) ජනාධිපතිවරයා පැමිණ සිටින විට උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු ය. ජනාධිපතිවරයා නොපැමිණි විට, කුලපතිවරයා එම උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු අතර, ජනාධිපතිවරයා සහ කුලපතිපතිවරයා යන දෙදෙනාම උපාධි ප්‍රදානෝත්සවයට පැමිණ නොමැති අවස්ථාවක උපකුලපතිවරයා එම උපාධි ප්‍රදානෝත්සවයේ මුලසුන දැරිය යුතු ය.

VIII වන කොටස

## විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය

මණ්ඩලය විසින් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය පත්කල යුතු බව.

**32.** තත්කාර්ය සඳහා නියාමාවලි මගින් නියම කරනු ලබන පරිදි බඳවා ගැනීමේ පරිපාටි සහ කාර්යපටිපාටියට අනුකූලව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන සෑම පත්කිරීමක් ම, මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සුදුසුකම් තීරණය කිරීම.

**33.** විශ්වවිද්‍යාලයේ ගුරුවරුන් සියලු දෙනාගේ සුදුසුකම්, තත්ත්ව සහතික කිරීම් සභාව විමසා මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් අවශ්‍ය යයි සළකනු ලබන අවස්ථාවල දී තත්ත්ව සහතික කිරීම් සභාව විමසා මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ තනතුරු ස්ථාපිත කිරීම, අවලංගු කිරීම සහ අත්හිටුවීම.

**34.** (1) එක් එක් පීඨයට අවශ්‍ය ගුරුවරුන්ගේ තනතුරු ස්ථාපිත කිරීමට, අවලංගු කිරීමට සහ අත්හිටුවීමට අදාළව ශාස්ත්‍රීය සභාව වෙත ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීම එක් එක් පීඨ මණ්ඩලයේ කාර්ය වන්නේ ය. ශාස්ත්‍රීය සභාව විසින් එම යෝජනා සළකා බලා ඇගයීමට භාජනය කල යුතු අතර, ඉන්පසු අදාළ පීඨ මණ්ඩලය වෙත සිය නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.

(2) විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන තනතුරු ස්ථාපිත කිරීමට, අවලංගු කිරීමට සහ අත්හිටුවීමට අදාළව මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයාගේ කාර්ය වන්නේ ය.

(3) විශ්ව විද්‍යාලයේ ගුරුවරයකුගේ යම් තනතුරක් හෝ යම් අනධ්‍යයන තනතුරක් ස්ථාපිත කිරීමට, අවලංගු කිරීමට හෝ

අත්හිටුවීමට පෙර පීඨ මණ්ඩලය විසින් යෝග්‍ය යයි සළකනු ලබන අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් තත්ත්ව සහතික කිරීමේ සභාවෙන් උපදෙස් ලබා ගත හැකි ය.

පරිවාස කාලසීමා සහ ස්ථිර කිරීම.

**35.** (1) ගුරුවරයකුගේ තනතුරක් සඳහා වූ සෑම පත්වීමක් ම පළමු අවස්ථාවේ අවුරුදු තුනක පරිවාස කාලසීමාවකට යටත් විය යුතු අතර, මණ්ඩලය විසින් එම පරිවාස කාලසීමාව වරකට එක් අවුරුද්දක කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, දීර්ඝ කළ හැකි සමස්ත කාලසීමාව අවුරුදු තුනක් නොඉක්මවිය යුතු ය. පරිවාස කාලසීමාව අවසානයේ දී නියමාවලි මගින් නියම කරනු ලබන පරිදි උචිත බඳවා ගැනීමේ පරිපාටිවල ස්ථිර කිරීම සඳහා විධිවිධාන සළසා ඇති පරිදි නියම හෝ කොන්දේසිවලට අනුකූලව, පත්වීම ස්ථිර කරනු ලැබිය හැකි ය.

(2) අනධ්‍යයන කාර්ය මණ්ඩලය කරනු ලබන සෑම පත්වීමක් ම පළමු අවස්ථාවේ දී අවුරුදු තුනක පරිවාස කාලසීමාවකට යටත් විය යුතු අතර, ඉන්පසුව නියමාවලි මගින් නියම කර ඇති ස්ථිර කිරීමේ නිර්ණායකවලට අනුකූලව එම තනතුරු ස්ථිර කරනු ලැබිය හැකි ය.

ගුරුවරුන් සහ අනධ්‍යයන තනතුරු දරන තැනැත්තන් විශ්‍රාම ගැනීම.

**36.** (1) ගුරුවරයකුගේ තනතුරක් දරන යම් තැනැත්තෙක් ඔහුගේ තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්නම්, ඔහු වයස අවුරුදු හැට සම්පූර්ණ කරන තුරු එම ධුරය දැරිය යුතු ය. ඔහුගේ හැට වන අවුරුද්ද අධ්‍යයන වර්ෂය අවසන් වීමට පෙර අවසන් වන්නේ නම්, ඔහුට එම අධ්‍යයන වර්ෂය අවසන් වනතුරු සේවයේ යෙදී සිටිය හැකි අතර, ඉන්පසු ඔහු සේවයෙන් විශ්‍රාම ගැන් වූ ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, එවැනි තනතුරක් දරන තැනැත්තකු මණ්ඩලය විසින් පැවැත්වීමට නියමිත පරීක්ෂණයකට පෙනී සිටීමට යටත්ව ඔහු කවර හෝ අවස්ථාවක දී විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ රාජකාරීය පැහැර හැරීම යන කරුණු මත සේවය අත්හිටුවනු ලැබිය හැකි අතර, එම පරීක්ෂණයෙන් පසු වරදකරු බවට පත්වුවහොත්, මණ්ඩලය විසින් සම්මත කරනු ලබන යෝජනා සම්මතයක් මත ඔහු සේවයෙන් නෙරපීම හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, වයස අවුරුදු හැටට එළඹුණු ගුරුවරයකු මණ්ඩලයේ මතය අනුව

ඔහු එම තනතුර නොකඩවා දැරීමට සුදුස්සකු වන්නේ නම්, ඔහු තවත් අවුරුදු පහක උපරිම කාලයක් සඳහා ගුරුවරයකු වශයෙන් සේවය කිරීමට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබිය හැකි ය. එසේ වුවද, එම කාලය එක් වරකට අවුරුදු එකක් නොඉක්මවන පරිදි විය යුතු ය. එසේ වුවද, ඔහු වයස අවුරුදු හැට සම්පූර්ණ කරන තෙක් වරකට අවුරුදු එකක කාලසීමාවක් බැගින් තවදුරටත් සේවා කාලය දීර්ඝ කළ හැකි ය.

(3) රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම යාමේ වයසට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විශ්වවිද්‍යාලයේ යම් අනධ්‍යයන තනතුරු දරන තැනැත්තන්ගේ විශ්‍රාම යාමේ වයස සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:

එසේ වුවද එවැනි යම් තනතුරක් දරන තැනැත්තකු මණ්ඩලය විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට යටත්ව විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ රාජකාරි පැහැර හැරීම මත ඔහුගේ සේවය අත්හිටුවනු ලැබිය හැකි අතර, පරීක්ෂණය අවසන් වීමෙන් පසු වරදකරු කරනු ලැබුවහොත් මණ්ඩලය විසින් සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක් මත ඔහු සේවයෙන් නෙරපීම හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම කළ හැකි ය.

(4) 35 වන වගන්තියේ දක්වා ඇති පරිවාස කාලසීමාව සම්පූර්ණ කිරීමට පෙර-

(අ) ගුරුවරයකුගේ තනතුරක් දරන යම් තැනැත්තෙක් වයස අවුරුදු හැටට එළඹෙන අවස්ථාවක දී ; හෝ

(ආ) අනධ්‍යයන තනතුරක් දරන තැනැත්තකු, (3) වන උපවගන්තියේ දැක්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විශ්‍රාම යාමේ වයසට එළඹෙන අවස්ථාවක දී ;

එම තැනැත්තා, එකී වයසට එළඹුන දිනයේ සිට විශ්‍රාම ගිය ලෙස සළකනු ලැබිය යුතු ය.

(5) සේවයෙන් නෙරපනු ලැබූ හෝ අනිවාර්ය නිවාඩු යවනු ලැබූ හෝ විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ රාජකාරිය පැහැර හැරීම සඳහා දඬුවම් කරනු ලැබූ විශ්වවිද්‍යාලයේ යම් තනතුරක් දැරූ සෑම තැනැත්තෙක් විසින් ම එකී සේවයෙන් නෙරපීම හෝ විශ්‍රාම ගැන්වීමට හෝ වෙනත් දඬුවමකට එරෙහිව විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

37. (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි රජයේ සේවයේ නිලධරයකු, එම නිලධරයාගේ, එම නිලධරයා සේවයේ නියුක්තව සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ගුරුවරයකු වශයෙන් ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය.

(2) විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරට තාවකාලිකව පත්කරනු ලැබූ යම් නිලධරයකුට එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු අතර, විශ්වවිද්‍යාල ගුරුවරයකුගේ තනතුරට ස්ථිරව පත්කරනු ලැබූ රාජ්‍ය සේවයේ යම් නිලධරයකුට හා ඔහු සම්බන්ධයෙන් එකී පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු විශ්වවිද්‍යාලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී එම තැනැත්තා විසින් විශ්වවිද්‍යාලයට ඉටු කරන ලද යම් සේවා කාලයක් එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

උසස් අධ්‍යාපන ආයතනවල ගුරුවරුන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට පත් කිරීම.

38. මණ්ඩලයේ ඉල්ලීම පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ යෙදී සිටින යම් ගුරුවරයකු, එම ගුරුවරයාගේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ එකී උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරියේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාල සීමාවක් සඳහා විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුගේ තනතුරට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත්, එවැනිම කැමැත්තක් ඇතිව මණ්ඩලය සහ එකී උසස් අධ්‍යාපන ආයතනය අතර එකඟවන නියම හා කොන්දේසි මත එම තැනැත්තා එම තනතුරට ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය. තව ද, ඔහු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් ගුරුවරයකු සේම එවැනිම විනය පාලනයකට යටත් වන්නේ ය.

## IX වන කොටස

### විශ්වවිද්‍යාල අභියාචනා මණ්ඩලය

**39.** (1) අමාත්‍යවරයා විසින් පරීක්ෂණ සහ විමර්ශන මූල මණ්ඩලය සඳහා කලින් කල සමුද්‍ර සාගර විද්‍යාව, සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා, ධීවර හා සාගර විද්‍යාව, කළමනාකරණය, ශාස්ත්‍රීය පරිපාලනය, මූල්‍ය කළමනාකාරීත්වය සහ නීති හෝ වෙනත් අදාළ සේවා අංශවල දැනුම හා පළපුරුද්ද ඇති තැනැත්තන් අතුරින් නව දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත පරීක්ෂණ හා විමර්ශන මූල මණ්ඩලයක්, පත් කරනු ලැබිය යුතු ය.

පරීක්ෂණ හා විමර්ශන මූල මණ්ඩලය පත් කිරීම.

(2) පරීක්ෂණ හා විමර්ශන මූල මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු, එසේ පත් කිරීමේ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස ඔහු නැවත පත් කිරීම සඳහා සුදුසසකු වන්නේ ය.

(3) පරීක්ෂණ හා විමර්ශන මූල මණ්ඩලයේ සාමාජිකයකු විසින් තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

**40.** (1) (අ) පත්වීමක්, උසස්වීමක්, සේවයෙන් නෙරපීමක්, සේවය අත්හිටුවීමක් තමාට විරුද්ධව ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගයකට එරෙහිව හෝ යම් වැටුප් විෂමතාවක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී; හෝ

විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සංයුතිය.

(ආ) විශ්වවිද්‍යාලයේ කටයුතුවලට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් යම් විමර්ශනයක් පැවැත්විය යුතු බවට නියම කර ඇති අවස්ථාවක දී,

අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලය විසින් එම අභියාචනය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා හෝ එම විමර්ශනය පැවැත්වීම සඳහා 39 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පරීක්ෂණ හා විමර්ශන මූල මණ්ඩලයට පත් කරන ලද තැනැත්තන් අතුරින් සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත වන විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් විසින්, ඔවුන් අතුරින් යම් තැනැත්තකු එකී මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(3) විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සභාපතිවරයා විසින් එම අභියාචන මණ්ඩලයට ලේකම්වරයකු පත්කරනු ලැබිය යුතු ය.

(4) විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයක රැස්වීම් කටයුතු පැවැත්වීම සඳහා වූ කාර්ය පටිපාටිය තත්කාර්ය සඳහා සාදනු ලැබූ රීතිවලට අනුව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, අභියාචන පිළිබඳ පරීක්ෂණයක් අවසන් කිරීමෙන් පසු හෝ විමර්ශන පැවැත්වීමෙන් පසු විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ තීරණය සහ ඒ සඳහා වූ හේතු ද සමග එම පරීක්ෂණය හෝ විමර්ශනය සම්බන්ධ වාර්තාවක් මණ්ඩලය වෙත ලබාදීම විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සභාපතිවරයාගේ කාර්ය වන්නේ ය. තව ද, එකී තීරණයේ සහ ඒ සඳහා වූ හේතුවල පිටපතක් එම තීරණයට එළඹි දින සිට සතියක් ඇතුළත අභියාචනය ඉදිරිපත් කළ තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

(6) විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් විසින් පවත්වන ලද යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සම්බන්ධයෙන් එම සාමාජිකයන්ට මුදල් විෂයයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ තීරණයට එරෙහිව අභියාචන.

**41.** 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම තීරණයට එරෙහිව 40 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ, එම තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් එම තීරණය සහ ඒ සඳහා හේතු යවන ලද දින සිට දින දාහතරක් ඇතුළත එම තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

**42.** (1) විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලය වෙත ගෙවන ලද හෝ එය විසින් ලබා ගන්නා ලද යම් ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු බව.

(2) මේ පනත හෝ යම් උචිත සාධනපත්‍රයක් යටතේ විශ්වවිද්‍යාල අභියාචන මණ්ඩලයේ සාමාජිකයකු විසින් සිදු කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ එම තැනැත්තාට එරෙහිව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එකී සාමාජිකයා විසින් දරන ලද යම් වියදමක්, එකී ක්‍රියාව සිදු කරන ලද්දේ සද්භාවයෙන් බවට අධිකරණය තීරණය කරන්නේ නම්, එකී වියදම, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් අයකර ගනු ලැබුවේ නම් මිස, එය විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

## X වන කොටස

## මුදල්

**43.** (1) විශ්වවිද්‍යාලයට එයට ම වෙන් වූ අරමුදලක් තිබිය යුතු අතර, එකී අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ අරමුදල.

(අ) පාර්ලිමේන්තුව විසින් විශ්වවිද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) කවර හෝ මූලාශ්‍රයකින් පරිත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් විශ්වවිද්‍යාලයට ලැබෙන සියලු මුදල්;

(ඇ) යම් අතුරු ව්‍යාවස්ථාවක විධිවිධානවලට අනුකූලව විශ්වවිද්‍යාලයට ගාස්තු වශයෙන් ගෙවනු ලබන මුදල්; සහ

(ඈ) මේ පනත යටතේ සාදනු ලබන යම් රීතියකට හෝ නියෝගයකට අනුකූලව විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු බවට නියම කර ඇති වෙනත් යම් මුදලක්.

(2) මේ පනත යටතේ විශ්වවිද්‍යාලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී විශ්වවිද්‍යාලය විසින් දරන ලද සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්, විශ්වවිද්‍යාලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලයට ආධාර පිණිස ලබා දෙන ප්‍රදාන.

**44.** වාර්ෂික විසර්ජන, පරිපූරක ඇස්තමේන්තු හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුව විසින් විශ්වවිද්‍යාලයට ආධාර පිණිස ප්‍රදාන වශයෙන් ලබා දී ඇති සියලු මුදල් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමෙන් පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා විසින් විශ්වවිද්‍යාලයට ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලය විසින් අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මූල්‍ය විසර්ජන සලකා බැලිය යුතු බව

**45.** 46 වන වගන්තියේ (ඈ) ඡේදය යටතේ අධ්‍යක්ෂ මුදල්ගේ සහාය ඇතිව පිළියෙල කරන ලද විශ්වවිද්‍යාලයේ අයවැය ඇස්තමේන්තු සහ වාර්ෂික මූල්‍ය විසර්ජන, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි දිනයට පෙර මණ්ඩලය විසින් සලකා බැලිය යුතු ය. මණ්ඩලය විසින්, එකී ඇස්තමේන්තුවලට සහ මූල්‍ය විසර්ජනවලට සුදුසු යයි සලකනු ලබන වෙනස් කිරීම් කරනු ලැබිය හැකි අතර, සම්පූර්ණ කරන ලද මුදල් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ගිණුම් සමග එකී වෙනස් කරන ලද ඇස්තමේන්තු සහ මූල්‍ය විසර්ජන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවල දී එම ඇස්තමේන්තු සහ මූල්‍ය විසර්ජන සංශෝධනය කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ, මුදල්ගේ කාර්ය භාරය.

**46.** (අ) රීති මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතිවලට අනුව සහ ආකාරයට විශ්වවිද්‍යාලයේ ගිණුම් තැබීම;

(ආ) විශ්වවිද්‍යාල අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ලබා ගැනීම සහ එකී මුදල් සුදුසු වැය ශීර්ෂවලට බැර කිරීම;

(ඇ) සියලු ගෙවීම් අදාළ නීතිවලට, මූල්‍ය රෙගුලාසිවලට සහ චක්‍රලේඛවලට අනුකූලව සිදු කිරීම;

(ඈ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී සහ විශ්වවිද්‍යාලයේ වාර්ෂික මූල්‍ය විසර්ජන පිළියෙල කිරීමේ දී මණ්ඩලයට සහයවීම; සහ

(ඉ) අවශ්‍ය අවස්ථාවන් හි දී 50 වන වගන්තිය යටතේ යම් පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කිරීම,

විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ, මුදල්ගේ කාර්ය වන්නේ ය.

47. විශේෂ කාර්ය සඳහා ලබා දී ඇති ප්‍රදානවලින් හෝ විශේෂ අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් විශ්වවිද්‍යාලයට උපචය වන ආදායම විශ්වවිද්‍යාලයේ ගිණුම්වල වෙන් වශයෙන් ගිණුම් තැබිය යුතු අතර, එකී ප්‍රදාන හෝ පරිත්‍යාග ලබා දී ඇත්තේ යම් අරමුණු හෝ කාර්ය සඳහා ද, එම අරමුණු හෝ කාර්ය සඳහා හැර විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කාර්ය සඳහා එකී මුදල්වලින් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

විශේෂ කාර්ය සඳහා වූ ප්‍රදානවලින් ලැබෙන ආදායම සඳහා වෙන් වශයෙන් ගිණුම් තැබිය යුතු බව.

48. 53 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත සම්ප්‍රේෂණය කිරීමට පෙරාතුව මණ්ඩලය විසින්, යෝජනා සම්මත මගින් අය වැය ඇස්තමේන්තු, වාර්ෂික මූල්‍ය විසර්ජන සහ විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් සම්මත කර ගනු ලැබිය යුතු ය.

මණ්ඩලය විසින් අයවැය අස්තමේන්තු වාර්ෂික මූල්‍ය විසර්ජන සම්මත කළ යුතු බව.

49. භාණ්ඩාගාරයේ ලිඛිත අනුමතයට යටත් ව අවශ්‍ය අවස්ථාවන් හි දී මණ්ඩලය විසින් වාර්ෂික ඇස්තමේන්තුවල එක් වැය ශීර්ෂයක සිට තවත් වැය ශීර්ෂයකට මුදල් මාරු කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

එක් වැය ශීර්ෂයක සිට තවත් වැය ශීර්ෂයකට මුදල් මාරු කිරීම.

50. (1) අවශ්‍ය අවස්ථාවන්හි දී සහ යම් අනපේක්ෂිත වියදම් සපුරාලීම සඳහා අධ්‍යක්ෂ, මුදල් විසින් කවර හෝ අවස්ථාවක දී වියදම් පිළිබඳ පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කිරීම නිත්‍යානුකූල වන්නේය.

පරිපූරක ඇස්තමේන්තු.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙන ලද පූර්ව අනුමතයක් නොමැතිව (1) වන උපවගන්තිය යටතේ පැන නගින පුනරාවර්තන ස්වභාවයේ මූල්‍ය බැරකම් නොදැරිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද පරිපූරක ඇස්තමේන්තු සම්මත කිරීම සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒවා සම්මත කිරීමෙන් පසු ඉදිරි වර්ෂයේ වාර්ෂික විසර්ජන සහිතව අමාත්‍යවරයා වෙත ලබා දිය යුතු ය.

51. (1) විශ්වවිද්‍යාලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

(2) විශ්වවිද්‍යාලයේ ගිණුම් විගණනය කිරීමට සහ ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණන කිරීමට අදාළ

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයට පත් කිරීම.

**52.** එක් එක් මුදල් වර්ෂය සඳහා වූ විශ්වවිද්‍යාලයේ ගිණුම් විගණනය කිරීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වාර්ෂික ගිණුම් සහ විගණකාධිපති වාර්තාව අමාත්‍යවරයා වෙත සම්ප්‍රේෂණය කළ යුතු බව.

**53.** (1) එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාව ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත විශ්වවිද්‍යාලය විසින් එම වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලය විසින් පළකරන ලද මත ප්‍රකාශ කිරීම් සහ එකී වාර්තාව අදාළ වන්නේ යම් ගිණුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ද, එම ගිණුම් ප්‍රකාශ ද සමග එම වාර්තාව අමාත්‍යවරයා වෙත සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ තමා වෙත සම්ප්‍රේෂණය කරන ලද සියලු ලේඛනවල පිටපත් සකස් කිරීමට සැලැස්විය යුතු අතර, එම වාර්තා සහ ගිණුම් අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂය අවසන් වීමට පෙර අමාත්‍යවරයා විසින් ඒවා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය. එම වාර්තාව සම්බන්ධයෙන් උද්ගතවන යම් ප්‍රශ්නයකට විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට පිළිතුරු සැපයිය යුතු ය.

## XI වන කොටස

### ශිෂ්‍ය සංගම් සහ වෙනත් සංගම්

ශිෂ්‍ය සංගම්.

**54.** (1) තත් කාලයේ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් වන තැනැත්තන් අතුරින් තෝරා පත්කර ගනු ලබන ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත වන ශිෂ්‍ය සංගමයක් විශ්වවිද්‍යාලයට තිබිය යුතු ය.

(2) ශිෂ්‍ය සංගමයට කරනු ලබන සෑම තෝරා පත්කර ගැනීමක් ම උපකුලපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි තැනැත්තකු හෝ තැනැත්තන් විසින් එක් එක් අධ්‍යයන වර්ෂය ආරම්භයේ දී රහස් ඡන්දයක් මගින් සිදු කරනු ලැබිය යුතු ය.

(3) ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන්ගේ ධුර කාලය එකී ශිෂ්‍ය සංගමය තෝරාපත් කරගනු ලැබූ අධ්‍යයන වර්ෂය අවසානයේ දී අවසන් වන්නේ ය.

ඇතැම් සමිති හා වෙනත් සංගම් පිළිගැනීම.

**55.** (1) අධ්‍යයන හා සමාජීය අරමුණු වැඩිදියුණු කර ගැනීමේ කාර්ය සඳහා පමණක් පිහිටුවනු ලැබුවා වූ ද තත්කාර්ය සඳහා අතුරු ව්‍යවස්ථා මගින් මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇති කටයුතු හෝ කර්තව්‍ය ඉටු කරනු ලබන්නා වූ ද ශිෂ්‍යයන්ගේ යම් සමිතියක් හෝ වෙනත් සංගමයක් මණ්ඩලය විසින් පිළිගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ යම් සමිතියක හෝ වෙනත් සංගමයක සාමාජිකත්වය සම්පූර්ණයෙන් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගෙන් පමණක් සමන්විත විය යුතු ය.

(3) 54 වන උපවගන්තියේ විධිවධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ පිළිගනු ලැබූ සමිති සහ වෙනත් සංගම් ලියාපදිංචි කිරීමේ ක්‍රමය, ඒවායේ කර්තව්‍ය, ඒවායේ ධුර දරන්නන් පත් කිරීම සඳහා වූ ඡන්ද විමසීම් පවත්වනු ලබන ආකාරය සහ එම ධුර දරන්නන්ගේ කාර්ය සහ කර්තව්‍ය මණ්ඩලය විසින් අතුරු ව්‍යාවස්ථා මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකිය.

මණ්ඩලය විසින් අනුමත ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍ය සංගම් ආදියට මුදල් වෙන් කළ හැකි බව.

**56.** අනුමත ක්‍රියාකාරකම් සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක් මණ්ඩලය විසින්, කලින් කල, ශිෂ්‍ය සංගම්වලට සහ 55 වන වගන්තිය යටතේ පිළිගනු ලැබූ වෙනත් සමිති හෝ සංගම්වලට හෝ වෙන් කර දෙනු ලැබිය හැකිය.

මණ්ඩලය විසින් ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාව, කාර්ය සහ කර්තව්‍ය නියම කළ යුතු බව.

**57.** මණ්ඩලය විසින් නියමාවලි මගින්—

(අ) ශිෂ්‍ය සංගමයේ කාර්ය සහ කර්තව්‍ය ;

(ආ) ශිෂ්‍ය සංගමයේ ධුර දරන්නන් සහ ශිෂ්‍ය සංගමය සංයුක්ත වන ශිෂ්‍ය නියෝජිතයන්ගේ සංඛ්‍යාව සහ ඔවුන් තෝරාපත් කර ගැනීමේ ක්‍රමය ;

(ඇ) ශිෂ්‍ය සංගමයේ ධුර දරන්නන්ගේ කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) ශිෂ්‍ය සංගමයක් විසින් පත් කරනු ලැබිය හැකි ස්ථාවර කාරක සභාවක් හෝ සභා සහ එම කාරක සභාවල කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) ශිෂ්‍ය සංගමයට හෝ 55 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් පිළිගනු ලබන යම් සමිතියකට හෝ වෙනත් සංගමයකට හෝ වෙන් කරන ලද මුදල් යෙදවිය හැක්කේ කවර කාර්යයක් සඳහා ද යන වග; සහ

(ඊ) ශිෂ්‍ය සංගමයේ සහ වෙනත් සමිතියක හෝ සංගමයක හෝ ගිණුම් පවත්වාගෙන යා යුතු සහ විගණනය කළයුතු ආකෘතිය සහ ආකාරය;

නියම කරනු ලැබිය යුතු ය.

ශිෂ්‍ය සංගමයක් සමිතියක් හෝ වෙනත් සංගමයක් අත්හිටුවීම හෝ විසුරුවා හැරීම.

**58.** උපකුලපතිවරයාගේ මතය අනුව ශිෂ්‍ය සංගමය හෝ යම් සමිතියක් හෝ වෙනත් සංගමයක් හෝ විශ්වවිද්‍යාලයේ කීර්ති නාමයට අහිතකර ලෙස හෝ අගතිදායක ලෙස ක්‍රියාකරන අවස්ථාවක හෝ එවැනි ශිෂ්‍ය සංගමක් හෝ සමිතියක් හෝ වෙනත් සංගමයක් හෝ මේ පනතේ හෝ වෙනත් යම් උචිත සාධනපත්‍රයක විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියාකරන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එකී ශිෂ්‍ය සංගමය හෝ සමිතිය හෝ වෙනත් සංගමය හෝ උපකුලපතිවරයා විසින් අත්හිටුවීම හෝ විසුරුවා හැරීම කරනු ලැබිය හැකි ය.

## XII වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලක සාමාජිකයන් වීම සඳහා නුසුදුසුකම්.

**59.** යම් තැනැත්තකු—

(අ) නිදහස් කරනු නොලැබූ බංකොලොත්භාවයට පත් වූ තැනැත්තකු හෝ බුන්වත්භාවයට පත් වූ හෝ තැනැත්තකු නම්;

(ආ) යම් චරිත දූෂණ වරදකට වරදකරු වී ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් වූ තැනැත්තකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඈ) විශ්වවිද්‍යාලය සමග හෝ එය වෙනුවෙන් හෝ ඇති කරගත් සිය සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම හැර වෙනත් යම් ගිවිසුමක් යටතේ ඍජුවම හෝ අන්‍යාකාරයකට තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ සිය භාවිතය හෝ ප්‍රතිලාභය සඳහා හෝ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් හෝ දරන්නේ නම් හෝ බුක්ති විඳින්නේ නම් ;

(ඉ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත් ;

(ඊ) විෂමාචාරය සඳහා යම් බලමණ්ඩලයක සාමාජිකත්වයෙන් හෝ විශ්වවිද්‍යාලයේ ධුරයකින් ඉවත් කරනු ලැබ ඇත්නම්;

(උ) රෝගාතුරවීම හෝ ශාරීරික හෝ මානසික අබලතාවක් නිසා යම් බලමණ්ඩලයක සාමාජිකයකු ලෙස නොකඩවා කටයුතු කිරීමට හෝ නොකඩවා විශ්වවිද්‍යාලයේ යම් ධුරයක් දැරීමට හෝ නුසුදුසු බවට තීරණය කර ඇත්නම්;

(ඌ) විෂමාචාරය හෝ දූෂණය හෝ සම්බන්ධයෙන් වරදකරු වී ඇත්නම් ; හෝ

(එ) සිය ධුරයේ බලතල බරපතල ලෙස අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් වරදකරු වී ඇත්නම්,

එම තැනැත්තා විශ්විද්‍යාලයේ යම් බලමණ්ඩලයක සාමාජිකයකු වශයෙන් හෝ විශ්වවිද්‍යාලයේ නිලධරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ නොකඩවා කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

විශ්වවිද්‍යාලයේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**60.** විශ්වවිද්‍යාලයේ සියලු නිලධරයන් හා සාමාජිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**61.** අල්ලස් පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා විශ්වවිද්‍යාලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

නොමනා තැනැත්තන් විශ්වවිද්‍යාල සීමාවන්ට ඇතුළුවීම තහනම් කිරීම.

**62.** (1) විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, කාර්ය මණ්ඩල සාමාජිකයකු හෝ ශිෂ්‍යයකු හැර වෙනත් යම් තැනැත්තකු විශ්වවිද්‍යාලය තුළ සිටීම, උපකුලපතිවරයාගේ මතය අනුව විශ්වවිද්‍යාලයේ හෝ එහි ශිෂ්‍යයන්ගේ සුභසාධනයට හිතකර නොවන අවස්ථාවක උපකුලපතිවරයා විසින් මණ්ඩලයේ කැමැත්ත ඇතිව එම තැනැත්තා වෙත කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබාදීමෙන් පසු උපකුලපතිවරයාගේ අත්සන යටතේ වූ තහනම් දැන්වීමක් එම තැනැත්තා වෙත භාර දිය යුතු අතර, එම දැන්වීම මගින් එම තැනැත්තාට විශ්වවිද්‍යාල සීමාවන්ට හෝ එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති එහි යම් කොටසකට ඇතුළුවීම හෝ ඒ තුළ රැඳී සිටීම තහනම් කරනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් එම තහනම ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන තෙක් එය බලාත්මකව පැවැතිය යුතු ය.

(2) විශ්වවිද්‍යාලයට හෝ එහි යම් කොටසකට ඇතුළුවීමෙන් හෝ එය තුළ රැඳී සිටීම තහනම් කරමින් (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව උපකුලපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එය එම සහතිකයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල සීමාවන් තුළට හෝ එහි යම් කොටසකට ඇතුළුවීම හෝ ඒ තුළ රැඳී සිටීම (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ තහනම් කරනු ලැබ සිටින යම් තැනැත්තකු එකී තහනම උල්ලංඝනය කරමින් සාධාරණ හේතුවක් නොමැතිව විශ්වවිද්‍යාල පරිශ්‍රයට හෝ එහි යම් කොටසකට ඇතුළු වන්නේ නම් හෝ ඒ තුළ රැඳී සිටී නම්, එම තැනැත්තා වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, එම තැනැත්තා එම පරිශ්‍රය හෝ එහි යම් කොටසක් තුළට ඇතුළු වී ඒ

තුළ රැඳී සිටින එක් එක් දිනය හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන්, දිනකට රුපියල් එක් දහසක් බැගින් වූ දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ යම් වරදක් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා සංඥෙය සහ ඇප දිය හැකි වරදක් විය යුතු ය.

**63.** (1) මණ්ඩලය විසින් මේ පනතේ විධිවිධානවලට යටත් ව පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සාදනු ලැබිය හැකි ය:— ප්‍රඥප්ති.

(අ) අන්‍යාකාරයකට විධිවිධාන සළස්වා ඇත්නම් මිස, විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක පුරප්පාඩු පිරවීමේ සහ එම බලමණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ ආකාරය ;

(ආ) ප්‍රදානය කරනු ලබන උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිබඳ තීරණය කිරීම ;

(ඇ) ගෞරව උපාධි හෝ වෙනත් ප්‍රදානයන් ප්‍රදානය කිරීම සඳහා අදාළ වන නිර්ණායක ;

(ඈ) කවර හෝ ආකාරයකට අරමුදල් හෝ දේපල ලබා දෙන අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීම ; සහ

(ඉ) මේ පනතේ විධිවිධාන යටතේ ප්‍රඥප්ති සෑදීමට බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම ප්‍රඥප්තියක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, ඒවා එසේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් වෙනත් යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

අතුරු ව්‍යවස්ථා.

**64.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය:—

(අ) උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අධ්‍යයන පාඨමාලා;

(ආ) අධ්‍යයන පාඨමාලා සඳහා සහ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා නියමිත අධ්‍යයන පාඨමාලා සහ විභාග සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කළ යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද, එම කොන්දේසි;

(ඇ) අධ්‍යයන පාඨමාලා, විභාග සහ උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා අය කළ යුතු ගාස්තු;

(ඈ) විශ්වවිද්‍යාලයේ විවිධ බලමණ්ඩලවලට සහ වෙනත් මණ්ඩලවලට නියෝජිතයන් තෝරා පත්කර ගැනීම හා සම්බන්ධ සියලු කාරණා;

(ඉ) විභාග පරීක්ෂකවරුන් පත් කිරීමේ කොන්දේසි හා ක්‍රමවේදය, ඔවුන්ගේ කාර්යභාරය, ඔවුන්ට ගෙවිය යුතු ගාස්තු සහ විභාග පැවැත්වීම සහ විභාගවල දී ප්‍රමිති පවත්වා ගෙන යාම; සහ

(ඊ) මේ පනතේ විධිවිධාන යටතේ අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය පවරා ඇති හෝ නියම කර ඇති සියලු කාරණා.

(2) විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම සහ විභාගවලට අදාළ හෝ ඒ හා සම්බන්ධ යම් කාරණාවක් සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවක කෙටුම්පතක් ශාස්ත්‍රීය සභාව විසින් පිළියෙල කොට මණ්ඩලය වෙත ඉදිරිපත් කරන තුරු මණ්ඩලය විසින් එවැනි අතුරු ව්‍යවස්ථාවක් සාදනු නොලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, එහි නිශ්චිතව සඳහන් දිනයක සිට බලාත්මක විය යුතු ය.

**65.** (1) විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන කාරණා සියල්ල සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:— රීති.

(අ) මේ පනතේ විධිවිධාන යටතේ රීති සෑදීමට නියම කර ඇති කාරණා; සහ

(ආ) මේ පනත යටතේ එම බලමණ්ඩලයට සිය කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට හැකිවන පරිදි විධිවිධාන සැලසීමට නියමිත කාරණා.

(2) (1) වන උපවගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ බලමණ්ඩලයක් විසින් සාදනු ලබන රීති එහි නිශ්චිතව දක්වනු ලැබිය යුතු යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

**66.** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන, මේ පනත මගින් පිහිටුවනු ලබන විශ්වවිද්‍යාලයට සහ ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

XIII වන කොටස

**අර්ථ නිරූපණය**

**67.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ— අර්ථ නිරූපනය.

"ශාස්ත්‍රීය සභාව" යන්නෙන් විශ්වවිද්‍යාලයේ ඉහළම ශාස්ත්‍රීය මණ්ඩලය අදහස් වේ;

"උචිත සාධනපත්‍රය" යන්නෙන් මේ පනතේ විධිවිධානවලට අනුකූලව සාදන ලද යම් නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ;

"බලමණ්ඩලය" යන්නෙන් මේ පනතේ 18 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් බලමණ්ඩලයක් අදහස් වේ;

"අතුරු ව්‍යවස්ථාව" යන්නෙන් මේ පනතේ 64 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවක් අදහස් වේ;

"උපාධිය" යන්නෙන් විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරනු ලබන උපාධි සහ පශ්චාත් උපාධි යන දෙවර්ගයේ ම උපාධි අදහස් වේ;

"පාලන මණ්ඩලය" යන්නෙන් විශ්වවිද්‍යාලයේ සමස්ත පරිපාලන මණ්ඩලය අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් නිපුණතා සංවර්ධන විෂයය පවරා ඇත්තේ කවර අමාත්‍යවරයකු වෙත ද, එම අමාත්‍යවරයා අදහස් වේ;

"අනධ්‍යයන කාර්ය මණ්ඩලය" යන්නෙන් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ කාර්ය මණ්ඩලය හැර, කාර්ය මණ්ඩලයේ අනෙකුත් සියලු සාමාජිකයන් අදහස් වේ;

"නියමාවලිය" යන්නෙන් මේ පනතේ 21 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන යම් නියමාවලියක් අදහස් වේ;

"රීතිය" යන්නෙන් මේ පනතේ 65 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක් විසින් සාදනු ලබන යම් රීතියක් අදහස් වේ;

"ප්‍රඥප්තිය" යන්නෙන් මේ පනතේ 63 වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන යම් ප්‍රඥප්තියක් අදහස් වේ;

"ඉගැන්වීමේ කාර්ය මණ්ඩලය" යන්නට ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය, පුස්තකාලයාධිපති, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, කථිකාචාර්ය සහ සහකාර පුස්තකාලයාධිපති ද ඇතුළත් වේ;

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**68.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

විශ්වවිද්‍යාලය පිහිටුවනතුරු විශේෂ විධිවිධාන.

**69.** (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, පීඨ පිහිටුවීම සහ සංස්ථාපනය කරන තුරු සහ විවිධ බලමණ්ඩල සංයුක්ත කරන තුරු සහ මේ පනත යටතේ නිලධරයන් හා වෙනත් කාර්ය මණ්ඩලය පත්කරන තුරු ජනාධිපතිවරයා විසින් නිපුණතා සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විමසා පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත අතුරු කමිටුවක් පත්කරනු ලැබිය යුතු ය:—

(අ) නිපුණතා සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ආ) 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත මගින් පිහිටුවන ලද ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා;

(ඇ) 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත මගින් පිහිටුවන ලද ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අතුරු කමිටුව, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පත් කිරීමේ දින සිට ආරම්භ වන මාස තුනක කාලයක් ක්‍රියාත්මකව කටයුතු කළ යුතු අතර, මේ පනත යටතේ විශ්වවිද්‍යාලයට ස්වකීය කටයුතු ආරම්භ කිරීමට හැකිවන පරිදි, ඊට අවශ්‍ය විය හැකි සියලු පියවර ගැනීම සඳහා සහ වැඩපිළිවෙල සකස් කිරීම සඳහා වගකිව යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කර්තව්‍ය ඉටුකිරීමේ දී අතුරු කමිටුවට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:—

(අ) විශ්වවිද්‍යාලයට කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන්, උපකරණ, ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් ලබාදීම සහ එක් එක් පීඨයේ සහ වෙනත් යම් ආයතනයක ව්‍යුහය සහ සංයුතිය තීරණය කිරීම සහ අවස්ථාවෝචිත පරිදි එම පීඨවලට හෝ ආයතනවලට පැවරිය යුතු ක්ෂේත්‍ර සහ විෂයයන් තීරණය කිරීම; සහ

(ආ) විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් සහ එම කාල සීමාව තුළ දී විශ්වවිද්‍යාලයේ කර්තව්‍ය සංවිධානය කිරීමේ, ඉටුකිරීමේ සහ විධාන නිකුත් කිරීමේ කාර්ය සඳහා මේ පනත යටතේ පත්කිරීමට නියමිත නිලධරයන් ඇතුළුව, යම් තැනැත්තකු හෝ තැනැත්තන් පත් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාලයේ වෙනත් යම් බලමණ්ඩලයක බලතල ක්‍රියාත්මක කිරීම;

(4) නිපුණතා සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් (2) වන උපවගන්තියේ දක්වා ඇති මාස තුනක කාල සීමාව, අමාත්‍යවරයා විසින් තවදුරටත් මාස තුනකට නොවැඩි කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය. ඉහත කී දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු එක් මාසයක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් දැන්වීමක්, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් සිදු නොවිය යුතු ය.

(5) යම් දැන්වීමක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ නිලධරයන් සහ සේවකයන්ට විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තිය ලබාදිය යුතු බව.

**70.** (1) 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එකී පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමිත දිනයේ දී එම ආයතනයේ කාර්ය මණ්ඩලයේ සිටි නිලධරයන්ට සහ සේවකයන්ට අවස්ථානුකූලව, විශ්වවිද්‍යාලයේ හෝ 5 වන වගන්තියේ (ඌ) ඡේදය යටතේ පිහිටුවන ලද ජාතික ධීවර හා සමුද්‍රීය පුහුණු ආයතනයේ සේවා නියුක්තිය ප්‍රදානය කරනු ලැබුවහොත්, ඔවුන් විසින් විශ්වවිද්‍යාලයේ සේවා නියුත්තිය භාර ගන්නේ ද නැද්ද යන්න පිළිබඳව නියමිත දිනයේ සිට මාස දෙකක කාලයක් ඉකුත් වීමට පෙරාතුව විශ්වවිද්‍යාලයේ පළමු උපකුලපතිවරයා අමතා යවන ලිඛිත සන්නිවේදනයක් මගින් එම උපකුලපතිවරයාට දැනුම් දිය යුතු ය.

(2) පළමු උපකුලපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තිය පිළිබඳ අර්පණය කරන ලදුව, එම සේවා නියුක්තිය භාර ගැනීමට

කැමැත්ත ප්‍රකාශ කරන සියලු නිලධරයන් හා සේවකයන්, 71 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක සඳහන් දිනයේ සිට විශ්වවිද්‍යාලයේ හෝ 5 වන වගන්තියේ (උ) ඡේදය යටතේ පිහිටුවන ලද ජාතික ධීවර හා සමුද්‍රීය පුහුණු ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් බවට පත්වන්නේ ය. එම නිලධරයන් සහ සේවකයන් ආයතනයේ සිටිය දී ඔවුන් විසින් භුක්ති විඳින ලද සේවා නියුක්තිය පිළිබඳ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන සේවා කොන්දේසි මත ඒ ඒ සේවකයන් හා නිලධරයන් සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු අතර, ඔවුන් විසින් ආයතනයට කරන ලද සේවා කාලය ඔවුන් විසින් විශ්වවිද්‍යාලයට කරන ලද සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු විශ්වවිද්‍යාලයේ හෝ 5 වන වගන්තියේ (උ) ඡේදය යටතේ පිහිටුවන ලද ජාතික ධීවර හා සමුද්‍රීය පුහුණු ආයතනයේ සේවා නියුක්තිය භාර නොගැනීමට කැමැත්ත පළ කරන අවස්ථාවක හෝ එම නිලධරයා හෝ සේවකයා 71 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයේ නිශ්චිතව දක්වා ඇති දින සිට සේවයෙන් විශ්‍රාම ගිය අයකු ලෙස සලකනු ලබන අතර, එම නිලධරයා හෝ සේවකයා විශ්‍රාම යාමේ වයසට එළඹීමෙන් පසු ආයතනයේ සේවයෙන් ඔහු විශ්‍රාම ගනු ලැබුවේ නම් ඔහුට හිමිකම් ලැබෙන විශ්‍රාම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඔහුට හිමිකම් තිබිය යුතු ය.

1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත ඉවත් කිරීම.

**71.** (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක නිශ්චිතව දක්වනු ලබන යම් දිනයක සිට 1999 අංක 36 දරන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය පනත ඉවත් කරනු ලැබේ. එසේ වුව ද, එසේ නිශ්චිතව දක්වනු ලැබිය යුතු දිනය නියමිත දිනයේ සිට මාස තුනකට පසු සහ මාස හයක් ඇතුළත වන දිනයක් විය යුතු ය.

(2) ඉහත කී පනත ඉවත් කිරීම නොතකා, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියමයේ නිශ්චිතව දැක්වෙන යම් දිනයක සිට සහ එදිනට පසුව—

(අ) ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සියලු නිශ්චල හා චංචල දේපල, (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියමයෙහි නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට විශ්වවිද්‍යාලය වෙත පවරනු ලැබිය යුතු ය;

(ආ) ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය විසින් හෝ එය සමග එළඹ ඇති (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින සියලු කොන්ත්‍රාත් හා ගිවිසුම්, විශ්වවිද්‍යාලය විසින් හෝ එය සමග ඇතුළත් වූ කොන්ත්‍රාත් හා ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියමයෙහි නිශ්චිතව දක්වා ඇති දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ අරමුදලේ බැරට ඇති සියලු මුදල්, එම දිනයේ සිට බලපවත්වන පරිදි මේ පනතේ 43 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය; සහ

(ඈ) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියමයෙහි නිශ්චිතව දක්වා ඇති දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, බලාත්මකව පවතින ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සියලු බැරකම් විශ්වවිද්‍යාලයේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.